අපි යෝජනා ඉදිරිපත් කළා පමණක් නොවෙයි. ' ඇනෙක්ෂර් සී ' එකේ අම්මා තාත්තා කවුද ඇහුවාම කියන්න කෙනෙක් නැතුව ගියා. කවුද ඒකෙ මව සහ පියා ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
මම අහන ප්‍රශ්නය ඒක නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පක්ෂයක් හැටියට ඉදිරිපත් කළ යෝජනා මොනවාද ? අපි දැනගන්න සතුටුයි.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
අන්න පුස්තකාලයේ තිබෙනවා. කියවා බලන්න පුළුවන්.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
අපි කියවා බලා තිබෙනවා. ඒවා රහසක් හැටියට තබා ගතයුතු නැහැ. තමුන්නාන්සේලාගේම නායකාව බොහෝම පැහැදිලිව මේ කරුණු කියනවා. 12.05.85 දින ' රිවිරැස ' පත්තරයේ මෙසේ සඳහන් වී තිබෙනවා :

> රට දෙකට නොබෙද සිංහල දෙමළ සමගියද ඇති කරමින් උතුරේ පවතින ත්‍රාලාම් ත්‍රස්තවාදය තුරන් කිරීමට ගත හැකි පියවරක් පිළිබඳව වැඩ සැලැස්මක් ගැන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකා සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය ' රිවිරැස ' ට හෙළි කළාය.

හංගලා තිබෙන දෙයක්, හෙළි කරන්නේ. ඔය " ඇනෙක්ෂර් සී " එකේ තිබෙන දෙයක් නොවෙයි. රහසක් හෙළි කරන්නේ.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
ඕක ඔයිට ඉස්සරවෙලාත් කියා තිබෙනවා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
මම තමුන්නාන්සේලාට පැහැදිලි කරන්නම්. අලුතෙන් දෙයක් හෙළි කළ යුතු නැහැ. හෙළි කරන්න තිබෙන්නේ හැංගී තිබෙන දෙයක්. එහෙම නම් එය සියලු පක්ෂවල සාකච්ඡාවේදී එළිදරවු නොකළ දෙයක්. මම තමුන්නාන්සේලාට කියවන්නම් :

> " ඉන්දියා රජය ලවා එවැනි ඉල්ලීමක් කරවීමට නම් ද්‍රවිඩ ජනතාව රට පාලනය කිරීමේ කටයුතුවලට සම්බන්ධ කර ගත හැකි සාධාරණ කොන්දේසි කීපයක් ඉදිරිපත් කළ යුතු බව පෙන්වා දුන් බණ්ඩාරනායක මහත්මිය, ඒ කොන්දේසි රට දෙකට නොබෙදෙන, රටේ ඒකීය භාවයට හානියක් නොවන අන්දමේ ඒවා බව විස්තර කළාය. "

එක බොහෝම පැහැදිලියි. බොහෝම පැහැදිලි තත්ත්වයක් අද තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
ඔව්.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
කුමක්ද ? රට දෙකට බෙදත්තේ නැහැ. අපේ ජාතික ගීය පිළිගත යුතුයි. ජාතික කොඩිය පිළිගත යුතුයි. තවත් විශේෂ වැදගත් කරුණක්. බුද්ධාගමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දී තිබෙන තත්ත්වය පිළිගත යුතුයි. අන්න ඒ කොන්දේසි මත යම් කිසි විසඳුමක් දෙන්න නැවත සාකච්ඡාවක් කැඳෙව්වොත් දෙමළ ජනතාවට දෙන සහන මොනවාද යන වග තමුන්නාන්සේලා ඉදිරිපත් කරන්න ලැස්තිද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
Sir, when you go for a discussion you go with an open heart. You do not go with conditions. You go with an open heart and then get your conditions. You come to an agreement that way. We came to three agreements like that with India. We went with an open heart pertaining to the Maritime agreement, the Indo-Ceylon Agreement and then the Kachchitivu Agreement. We did not go to sign all those three agreements with conditions. We went with an open heart.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමනි, කාරණය බොහෝම පැහැදිලි වෙනවා. මේ පත්තරයේ පළ වී තිබෙන්නේ මෙහෙමයි :

" මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තමාන්, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායක ඒ. අමිර්තලිංගම් මහතාත් අතර සාකච්ඡාවක් පැවැති බව සඳහන් කළ බණ්ඩාරනායක මහත්මිය, ඉන්දියාව ඉල්ලීමක් කළහොත් ඊළම් ත්‍රස්තවාදීන් එය පිළිගන්නා බවත්, ඉන්දියාවේ ඉල්ලීමට පිටුපැවොත් ඔවුන්ගේ දේශපාලන ව්‍යාපාර සම්පූර්ණයෙන් නැතිවන නිසා ඔවුන්, ඉන්දියාවේ අදහස්වලට එකඟ වන බව අමිර්තලිංගම් මහතා තමා සමග කී බවත් ඇය කීවාය. "

අමිර්තලිංගම් මහතා සමග මැතිණිය මේ පිළිබඳව සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී එළඹුණු තීරණත් සිරිමා බණ්ඩාරනායක මැතිණිය හෙළිදරව් කර තිබෙනවා.

. . . . . මහ මැතිවරණයක් පැවත්වීමේදී උතුරේ අයටත් මැතිවරණයට සම්බන්ධ වෙන්න පුළුවන්. '

හදිසි අවස්ථාව දීර්ඝ කිරීමේ යෝජනාව සාකච්ඡා කෙරුණු හැම අවස්ථාවකදීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියා තිබෙන්නේ මහ මැතිවරණයක් පවත්වන්නය කියායි. උතුරේ දෙමළ නියෝජිතයන්ට පාර්ලිමේන්තුවට එන්න මහ මැතිවරණයක්ම පවත්වන්න ඕනෑ නැහැ. ඒ අය පාර්ලිමේන්තුවට ගෙන්වා ගැනීම සඳහා අතුරු මැතිවරණ පවත්වන්න පුළුවනි.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ඒ කොහොමද ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
හිස් වී තිබෙන ඒ ආසන සඳහා අතුරු මැතිවරණ තිබ්බාම ඒ ආසන සඳහා තේරී පත් වී පාර්ලිමේන්තුවට එන්න ඒ දෙමළ නියෝජිතයන්ට බැරිද ? පුළුවන්.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
අපි සියලු දෙනාම ගෙදර යන්න ලෑහැස්තියි. ඒ නිසා මහ මැතිවරණයක් තබන්න. එහෙම තැන්නම් ඉල්ලා අස් වෙන්න. ඒකයි, හාමුදුරුවරුන් කියන්නේ. [බාධා කිරීම්] එහෙම නැතිව මේකෙ එල්බගෙන තවත් කන්න. [බාධා කිරීම්] ජනතාවට අවස්ථාවක් දෙන්න. [බාධා කිරීම්]

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
මහ මැතිවරණයක් තියන්න කියල මේ වගේ අවස්ථාවකදී කියන්නෙ කවුද ? දෙමළ මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුවට ගේන්න නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයට මේ පාර්ලිමේන්තුවට එන්න. මේක තේරුම් ගන්න ඕනෑ.[බාධා කිරීමක්]

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඒකෙ ඇති වැරැද්ද මොකක්ද ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
තමුන්නාන්සේලාට ඕනෑ කරන්නේ මේ ප්‍රශ්නය විසඳන්න නොවෙයි. මේ ආණ්ඩුව වටටලා වෙනත් ආණ්ඩුවක් පත් කර ගන්නයි ; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුවට ගෙන්නා ගන්නයි. එහෙම නම් තමුන්නාන්සේලා කෙළින්ම රටට කියන්න ඕනෑ, ' අපට ඕනෑ මේ ප්‍රශ්නය විසඳන්න නොවෙයි. මේ තුළින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවට ගෙන්වා ගන්නයි ; බලයට එන්නයි ' කියා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඒ තුළින් ප්‍රශ්නය විසඳන්නයි. දැනට තමුන්නාන්සේලා අට අවුරුද්දක් ආණ්ඩු කර තිබෙනවා. තමුන් මොකක්ද, මේ දක්වා කර තිබෙන්නේ ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)
' රිවිරැස ' පත්‍රයේ වාර්තාකරු සිරිමා බණ්ඩාරනායක මැතිණියගෙන් අහනවා, මේ විධියේ ප්‍රශ්නයක් :

' මැතිණිය එවැනි ඉල්ලීමක් කළොත් ඉන්දියාව ඒකට කැමති වෙයිද ? '

ඒක බොහොම වැදගත් ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට මැතිණිය දෙන පිළිතුර මොකක්ද ?

' මං එවැනි ඉල්ලීමක් කළොත් ඉන්දියා රජය ඒකට අකමැති නොවන බව මට හොඳටම විශ්වාසයි. තමුන් ඒ සඳහා ඉදිරිපත් කරන කොන්දේසි ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කරන බවට මට සහතිකයක් දෙන්න බැහැ. මන්ද, මට බලයක් නැහැනෙ. '

එතුමියට හොඳටම සහතිකලු. එහෙම නම්, මේ පිළිබඳ මුල් කොන්දේසි, ප්‍රධාන කොන්දේසි සියලුම පක්ෂ පිළිගන්නවා නම්—අතරමහදී සාකච්ඡාවෙන් නැතිව ගියත් කමක් නැහැ.—ඒවාටත් වඩා මේ රටේ දෙමළ ජනතාවට දිය යුතු තවත් අයිතිවාසිකම් තිබෙනවා නම් ඒවා මොනවාදැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රසිද්ධියේම රටට ප්‍රකාශ කරන්න ඕනෑ නේද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
" Annexure C " එක පිළිගත්තේ නැති නිසා මේ ආණ්ඩුව කෙරෙහි ඉන්දියාවේ විශ්වාසයක් නැහැ. සිංහලෙන්ම කියනවා නම් එපමණයි. ආයෙත් අහන්න දෙයක් නැහැ. නමුත් " Annexure C " එක ඉන්දියාව පිළිගත්තා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

සිරිමා බණ්ඩාරනායක මැතිණියගේ අර ප්‍රකාශයෙන් තේරෙන්නේ මොකක්ද ? ඒ මොන කොන්දේසියක් පිළිගත්තත් සිරිමා බණ්ඩාරනායක මැතිණි—බලයේ නැත්නම් ඒ කොන්දේසි ක්‍රියාත්මක කරන්න පුළුවන්යයි සහතික වෙන්න බැරිබව කීම නේද ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

අර " Annexure C " එකත් ඉන්දියාව පිළිගත්තා. මෙහෙ පිළිගත්තේ නැහැනේ ? ඒකයි. වුණේ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මේ පාර්ලිමේන්තුවේ ඉන්න කිසිම කෙනෙක් යුද්ධයකට කැමැති නැහැ. මිනී මරන්න, ලේ වගුරුවන්න කවුරුවත් කැමැති නැහැ. හමුදාවෙන් වුණත්, ත්‍රස්තවාදීන්ගෙන් වුණත් එවැන්නක් වෙනවාට කවුරුවත් කැමැති නැහැ. එහෙම නම් මේ අවස්ථාවේදී අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එක දෙයක් අහන්න තිබෙනවා. සිරිමා බණ්ඩාරනායක මැතිණිය කියනවා, මේ ගැන ඉන්දියාවත් එක්ක කථා කරන්නය කියා. අනෙක් පැත්තෙන් අපේ රටේ දෙමළ උදවියට දෙන්න තිබෙන සහන ගැනත් කථා කරනවා. නමුත් අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා අද කළ කථාවේදී මේ විධියේ සඳහනක් කර තිබෙනවා :

"North and East are only 8,000 sq.miles or 28.7 of the geographical area of this country. So far for this whole campaign you need at least 100,000 strong army, navy, air force and police organizations. I do not know when you are going to raise it up to that level."

ලක්ෂයක් බඳවා ගත්තලු. මොනවා කරන්නද ? ඉන්දියාව එක්ක කථා කරන්නද, ගහ ගන්නද ? ඒ ලක්ෂය මොනවාටද කියා අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි. නමුත්තාත්සේලා බොහෝම පැහැදිලිව කියනවා දේශපාලන විසඳුමක් අවශ්‍යයි කියා. නමුත්තාත්සේලාගේ නායිකාව කියනවා එසේ විසඳුමක් දී, ඉන්දියාවත් එක්ක කථා කර, ත්‍රස්තවාදීන් මෙහාට එවන්නය, ඒ අයට පාලනයට සහභාගී වෙන්නට අවස්ථාවක් ලබා දෙන්නය කියලා ඉන්දියාවට කියන්නය කියා. අනික් පැත්තෙන් තමුන්නාත්සේලා මුළු රටටම කියන්නේ මොකක්ද ? නමුත්තාත්සේලා බොහෝම පැහැදිලිව කියනවා මේ හමුදා ශක්තිය තව වැඩි කරන්නය, අවි ආයුධ ශක්තිය තව වැඩි කරන්නය, එහෙම නැත්නම් කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ කියලා. මම තමුන්නාත්සේලාගෙන් අහනවා මේ අවස්ථාවේදී මේ විධියේ දෙබිඩි කථා කරන්නේ මොන හේතුවක් උඩද කියලා.

අපේ දේශපාලන මති මතාන්තර තිබෙනවා. ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව අපේ තොයෙක් ප්‍රශ්න තිබෙනවා. ඒවා අපට එකඟ වෙන්න බැරි ඒවා. නමුත් මේ ප්‍රශ්නය දේශපාලන හේතුන් නිසා ලංකා ඉතිහාසයේ පරම්පරාවෙන් පරම්පරාවට අපි උරුම කරගෙන ආ ප්‍රශ්නයක්. හොඳයි අපි ඒ මතිමතාන්තර පැත්තකින් තබමු. පැත්තකින් තබලා අපි එකට එක්කහු වෙමු. මේ වාගේ අවස්ථාවකදී අපට දෙන්න පුළුවන් දේ එච්චරයි. කොයි පක්ෂයකට හෝ සිංහලයන් හැටියට දෙන්න පුළුවන් දේ එපමණයි. ඊට වඩා දෙන්න බැහැ. නමුත් ඊට පස්සේ කොයි ආණ්ඩුවකට හෝ ස්ථිර ක්‍රියා මාර්ගයක් ගන්න පුළුවන්.

අද මේ විධියේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙද්දී එක පැත්තකින් ත්‍රස්තවාදීන් අහිංසක ජනතාව මරද්දී, අපේ හමුදාවේ නිලධාරීන් මරද්දී අනික් පැත්තෙන් අපේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් පොත්වල වාර්තාගත වී තිබෙන්නේ අහිංසක දෙමළ මිනිසුන් මරනවාය කියලයි. ඒක අමතක කරන්න එපා. එහෙම සිද්ධ වෙලත් තිබෙනවා. එහෙම නම් මේ ලේ වැගිරීම නවත්වන්න අපි කුමක් කළ යුතුද ?

පෞද්ගලික වශයෙන් අපි අපේ විශේෂ අවධානය මේ කාර්‍යය කෙරෙහි යොමු කළ යුතුයි. අද අපි දන්නවා මෙහි ප්‍රතිඵල කොයි විධියටද මේ රටේ ජනතාවට භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ කියා. මම හිතන්නෙ නැහැ ගරු අග්‍රාමාත්‍යතුමා ඔය නිවාස හදගෙන යන වේගයට ඉදිරියට එතුමාට මේ රටේ නිවාස හදගෙන යන්නට හැකි විධියේ වාතාවරණයක් මේ රටේ ඇති වේවි කියා. මම හිතන්නෙ නැහැ මහවැලිය කොයි තරම් සාර්ථක වුණත් එහි ප්‍රතිඵල මේ රටේ ජනතාවට භුක්ති විඳිමට සුදුසු වාතාවරණයක් මේ රටේ ඇතිවේවි කියලා. රට කොයිතරම් සංවර්ධනය වුනත් මම හිතන්නෙ නැහැ ඒ සංවර්ධනය විමේ වාසිය මේ රටේ ජනතාවට උරාගන්න පුළුවන් ශක්තියක් ඇති වාතාවරණයක් මේ රටේ ජනතාවට උද වේවි කියා. මම හිතන්නේ නැහැ අපේ නිබෙන වත්කම්වලින් හමුද තර කරන්නවත් අවි ආයුධ ලබාගන්නවත් අපේ මුදල් ඇමතිතුමාට ශක්තියක් ඇති වේවි කියලා.

එහෙම කළොත් අනික් පැත්තෙන් අපේ වැඩ කටයුතු අඩාල වෙනවා. එහෙම අඩාල වන විට අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය අඩපණ වේවි. ඔවුන්ට අධ්‍යාපනයක් ලබාගන්නට අවස්ථාවක් නැති වේවි. ගුරුවරුන් නැති වේවි. ගොඩනැගිලි නැති වේවි. ඒකයි වෙන්නෙ. ඒත් අද ගම්බද ජනතාවට කථා කළොත් ඔවුන් කියන්නේ කුමක්ද ? අපේ වැඩ නතර කර හරි කමක් නැහැ ආරක්ෂක සංවිධාන තර කරන්න කියලයි. ඇයි එහෙම කියන්නෙ ? ජාතියට තිබෙන ආදරය නිසයි. නමුත් කොයි ආණ්ඩුවක් බලයේ සිටියත් ඒකත් අපට කොයි තරම් දුරට කරන්න පුළුවන්ද කියා අපි කල්පනා කරන්න ඕනෑ.

මේ විධියට කල්පනා කරන විට අපි ඉතිහාසයෙන් ගෙනැවිත් තිබෙන මේ දායාදය සම්බන්ධයෙන් මම හිතනවා එක් පියවරක් අපි ගත යුතුයි කියා. මේක භයානක තත්ත්වයක්. මේ භයානක තත්ත්වය තුළ අපි මේ කාල පරිච්ඡේදයේදී මේ ප්‍රශ්නයට විසඳුමක් නුදුන්නොත් වෙනත් ආණ්ඩුවකට වුණත් දේශපාලන හේතුත් උඩ විසඳුමක් දෙන්න නැවතත් අවස්ථාවක් නැතිව යනවා.

අපට පුළුවන් නොයෙක් නොයෙක් මත ප්‍රකාශ කරන්න. නමුත් සත්‍යය කුමක්ද කියල අපි කල්පනා කළ යුතුව තිබෙනවා. අපි දන්නවා මේ රටේ කොපමණවත් ගිවිසුම් ඇති වුණ බව. දේශපාලන වාසි නිසා ඒ ගිවිසුම් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. අපි නැවතත් මේ ගැන අවධානය යොමු කළ යුතුව තිබෙනවා. අපි දේශපාලන වශයෙන් කොයි තරම් වෙනත් මත දරුවත්, නමුත්තාත්සේ දන්නවා, අද උතුර නැගෙනහිර ප්‍රදේශවල තත්ත්වය කුමක්ද කියා. අද අපි උතුර පමණක් ගත්තොත් එය සම්පූර්ණයෙන්ම දෙමළ ජනතාවට පමණක් ජීවත් වන ප්‍රදේශයක් බවට පත් වෙලා අවසානයි. එය නැහැයි කියන්න බැහැ. නමුත් අපේ සෙසු ප්‍රදේශ සියලුම ජන කොටස් ජීවත් වන ප්‍රදේශ බවට පත් වී තිබෙනවා. මුස්ලිම් ජනතාව ජීවත් වෙනවා ; දෙමළ ජනතාව ජීවත් වෙනවා ; සිංහල ජනතාව ජීවත් වෙනවා ; වෙනත් සුළු සුළු ජන කොටස් ජීවත් වෙනවා. ඒ වාගේම නොයෙක් ආගමිකයන් වශයෙන් ජීවත් වෙනවා.

එසේ නම් මේ පුංචි රටේ තමන්ටය කියා කොටසක් අයිතිව තිබෙන්නේ කාටද ? දෙමළ ජනතාවට පමණයි. සිංහල ජනතාව වන මහ ජාතියට ඒ අයිතිය නැහැ. අපි කවුරුත් ඒ ගැන කල්පනා කරන්නට ඕනෑ. සියලුම දේශපාලන පක්ෂවල උදවිය මේ ප්‍රශ්නය දෙස තාත්විකව කල්පනා කළයුතු අවස්ථාවකට අද පත්ව සිටිනවා.

අනුරාධපුරයේ සිද්ධිය සම්බන්ධව මම පුද්ගලිකව දන්නේ නැහැ. ඒ නිසා කලවානේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සමහර කරුණුවලට ගරු ජාතික ආරක්ෂක ඇමතිතුමා ඊට පිළිතුරු දේවි. එතුමා ඉදිරිපත් කළ සමහර අදහස් මම අනුමත කරනවා. දන්වත් අද අදවත් හැම දෙනාම එකට එක්කාසුවෙලා මේ මිනිස්සු මැරෙන එක නවත්වන්නට වහාම පියවරක් ගතයුතුය කියන කාරණය මම අනුමත කරන්නට කැමතියි. අප සියලු දෙනාම එක්කාසු වන්නට ඕනෑ. අපේ ඒකීයභාවය, අපේ ජාතික ගීය, අපේ සිංහල ධජය, ඒවගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බෞද්ධාගමට හිමි තැන යන මේ මූලික කරුණු හතර පිළිගෙන ඊලඟට දෙමළ ජනතාවට තවත් දියයුතු සහාය කුමක්ද කියා අපි සියලුදෙනාම එකතු වී තීරණයක් කර එය මුළු රටටම ප්‍රකාශ කරන්නට ඕනෑ. වුවමනා නම් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සිරිමා බණ්ඩාරණායක මැතිනිය ලවා ඉන්දියාණ්ඩුවට කියවා තීරණයකට මම හිතන විධියට කවුරුවත් මැලිවන එකක් නැහැ. අපි පැහැදිලිව මේ ප්‍රශ්නය අද රට හමුවේ තබනවා. ඒවාගේම මුලු රටේම ජනතාව සියලුම දේශපාලන පක්ෂවලින් මේ තත්ත්වය අද බලාපොරොත්තු වෙනවා. සියලුම ආගමික නායකයින්ද මේ තත්ත්වය දෙස අද නැවත වරක් හැරී බලන්නට ඕනෑ. ඒක ඉතා වැදගත්. සියලුම දේශපාලන පක්ෂවල සියලුම ජනතා කොටස්වල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා]

අදහස් අනුව තීරණයක් ගන්නා අවස්ථාවේදී සියලුම ආගමික කොටස්වල පූර්ණ සහයෝගය ලැබිය යුතුව තිබෙනවා. මම මේ කියන කාරණය තමුන්නාන්සේ වරදවා වටහා ගන්නට එපා. මම මේ කියන්නේ ගරුතර මහා සංඝරත්නය ගැන පමණක් නොවෙයි. විශේෂයෙන්ම කතෝලික සභාව තුළ මුළු රටේම සිටින කතෝලික නායකයින් මේ තීරණයන්ට පක්ෂපාතී විය යුතුව තිබෙනවා. ඒක ඉතාම වැදගත්. ආගමික නායකයින්ට පුළුවන්, විශේෂ මෙහෙයක් කරන්නට. ඒ සියලුම ආගමික නායකයින් ඒ මෙහෙය ඉටු කිරීම මේ අවස්ථාවේ හැටියට ඉතා වැදගත් බව මතක් කරන්නට සතුටුයි.

කලවානේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් අපි මාසයෙන් මාසය සාකච්ඡා කර මේ රටේ හදිසි නීතිය දීර්ඝ කරනවා. එසේ දීර්ඝ කරන්න, කරන්න, මේ රටේ අපරාධ වැඩි වෙනවා. මම තමුන්නාන්සේලාගෙන් එක ප්‍රශ්නයක් අහනවා. අපි හදිසි නීතිය ඉවත් කළහොත් මේ මේ අපරාධ නතර වෙයිද ? ඒ කාරණය ඉතා වැදගත්. අපි හදිසි නීතිය ඉවත් කළොත් උතුරු නැගෙනහිර පළාත්වල දැනට කරගෙන යන ප්‍රචණ්ඩ ක්‍රියා නතර වීමට එය රුකුලක් වෙයිද ? ඒ සහතිකය කාටද දෙන්නට පුළුවන් ? ඒ කාරණය ඉතා වැදගත්.

අද කලවානේ ගරු මන්ත්‍රීතුමාත් යෝජනා කළේ ආරක්ෂක හමුදු උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවලින් ඉවත් කරන්නටත් ත්‍රස්තවාදීන්ට ඔවුන්ගේ වැඩකටයුතු නතර කර දේශපාලන විසඳුමකට එන්නටත් ඕනෑය කියලයි. උතුරු නැගෙනහිර ප්‍රදේශවල සහ මේ රටේ තොයෙකුත් ප්‍රදේශවලට අපේ හමුදු යැවුයේ ඒ ප්‍රදේශවල කලබල ඇති වුණු නිසා බව තමුන්නාන්සේ දන්නවා. නිකම්ම යැවීවේ නැහැ. අද තමුන්නාන්සේලා ප්‍රකාශ කරනවා හමුදුව නිසා කලබල ඇති වුණාය කියා. අසවල් තැන අසවල් සිද්ධිය සිදු වුණ නිසා අනුරාධපුරයේ මේ සිද්ධිය ඇති වුණාය කියා මේ පාර්ලිමේන්තුව මගින් විදේශ ප්‍රවෘත්ති මාධ්‍යයන්වත් දෙන්නට සමහර අය උත්සාහ කරනවා.

මේ ප්‍රශ්නය නතර වන්නට දේශපාලන පක්ෂ වශයෙන් දෙන්නට පුළුවන් වගකීම කුමක්ද ? කලවානේ ගරු මන්ත්‍රීතුමාට ඒ සහතිකයේ කොටසක් භාර ගන්නට පුළුවන්. මන්ද, ඉන්දියාවත් රුසියාවත් අතර විශේෂ සම්බන්ධතාවය අපි කවුරුත් දන්නවා. අද ඉන්දීය අගමැති රජීව් ගාන්ධි මහතා රුසියාවේ නායකයින් සමග සාකච්ඡා කරනවා. ඒ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් හැටියට— අපි දන්නේ නැහැ රුසියාවේ සිට යම්කිසි ප්‍රවෘත්ති මාධ්‍යයක් කියනවාද කියලා, මේ පාර්ලිමේන්තුවේදී කලවානේ ගරු මන්ත්‍රීතුමා මගින් ප්‍රකාශයට පත් කරන්නය කියා—

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Sir, I want to tke the strongest objection to this statement.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

I withdraw that.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

It is an utterly irresponsible and unjustified statement.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

I withdraw that statement.

ඒ සැකය අපට පහළ වන්නේ මෙන්න මේ නිසයි. මේ ත්‍රස්තවාදය නතර කරන්නට අපේ ලංකාවට නොහැකි වී තිබෙන්නේ ඉන්දීය රජයේ සමහර කොටස් ත්‍රස්තවාදීන්ට සහයෝගය දෙන නිසයි ; අපේ රටේ සිටින දුවිඩ ත්‍රස්තවාදීන් ඉන්දියාවේ කඳවුරුවල පුහුණුව ලබන නිසයි ; ඔවුන්ට ආයුධ සපයන නිසයි. ඊළාම් ගුවන් විදුලිය ප්‍රචාරය වන්නේත් ඒ සහයෝගය නිසයි. ඉන්දියාව ඒ කටයුතු නතර කළොත් මේ ත්‍රස්තවාදය නතර කරන්නට අපට පුළුවන් වෙනවා. එය ඉතාම වැදගත්. හිටපු අගමැතිතිය, තමුන්නාන්සේලාගේ නායිකාව, මුළු රටටම කීවා—

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

කරුණාකර තොන්ඩමන් මහත්මයාට වැදල කියන්න මේක නවත්වන්නය කියා. කීවොත් අපූරුවට නවත්වයි. [බාධා කිරීමක්]

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

සුළු පිරිසක් සිටින මේ තොන්ඩමන් ඇමතිතුමා ගැන විශ්වාස කරන්න එපා. ජන්දයකයින් විශාල ගණනක් ජන්දය දී තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායිකාවගේ කථාව ගැන විශ්වාස කරන්න. ඉන්දියාවේ ගරු අගමැතිතුමාට කියන්නැයි සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියට කියන්න. ඒකයි, තිබෙන රහස.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඇයි තොන්ඩමන් ? එයාට තමුන්නාන්සේලා බයයි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

තමුන්නාන්සේලාත් බයයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

කාලයක් යන විට එයා කියන විධියට නටන්න වෙයි.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මේ වැඩ පිළිවෙළ නතර කිරීමට තිබෙන ශක්තිය ආයුධවල ශක්තිය නොවෙයි ; යුද්ධ ශක්තිය නොවෙයි.

කේ. අබේවික්‍රම මහතා (මාතර දිසා ඇමතිතුමා)
(திரு. கே. அபேவிக்ரம—மாத்தறை மாவட்ட, அமைச்சர்)
(Mr. K. Abeywickrema – District Minister, Matara)

Sir, I rise to a point of Order. The hon. Member for Attanagalla is an experienced Member of this House. He should know how to address the other hon. Members of this House.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

හෝ ! නෙතුශ්‍රීත් විරාජමානවූ තොන්ඩමන් මහ රජාණන් වහන්සේට කියන්න. ඒ මහා උත්තමයාට කියන්න. තමුන්නාන්සේලාගේ නායකයාණන්ට කියන්න. ඒ පැත්තට ගියාම ජන්ද ගන්නට තිබෙනවා. [බාධාකිරීමක්]

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

ගරු කථානායකතුමනි, අපට තිබෙන ප්‍රධාන ශක්තිය සිංහල ජනතාවගේ එකමුතුභාවයේ ශක්තියයි. ඊට වඩා ශක්තියක් නැහැ. මේ රටේ ඉතිහාසය අනුව ජයග්‍රහණය ලබා ගෙන තිබෙන්නේ ඒ ශක්තිය තුළින් පමණයි. එය අපි නැවතත් සිහිපත් කරන්නට ඕනෑ. අපට නිදහස ලැබුණු දවසේ සිටම මේ ශක්තිය එක අතකින් දෙදරුම් කැවා. දෙදරුම් කැවාය කියන්නේ මෙන්න මේ නිසයි. අපි ජන්ද බලයෙන් ආණ්ඩු පත් කර ගන්නා විට සියයට 40 ක් පමණ හැම අවස්ථාවකම ඒ ආණ්ඩුව කරන වැඩවලදී සහභාගීත්වයක් ලබා නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද තත්ත්වයත් ඒ විධියටමයි ගමන් කරන්නේ. මම ඒ අරගෙන පෙත්තුවේ ඉතිහාසයයි. සිංහලයා දෙකට බෙදිලා. තුනට හතරට බෙදිලා. සිංහලයෝ දේශපාලන වශයෙන් බෙදිලා ; ආගම් වශයෙන් බෙදිලා ; කුල වශයෙන් බෙදිලා. දෙමළ ජනතාවට අපි විරුද්ධ වෙනවා නොවෙයි ; දොස් කියනවා නොවෙයි. ඒ හැම දෙයක්ම තිබියදීත් ඒ අය දෙමළ ජනතාව හැටියට එක් වී සිටිනවා. ඒ අයටත් ආගම් ප්‍රශ්න තිබෙනවා. හින්දු භක්තිකයො ඉන්නවා. කතෝලිකයො ඉන්නවා. කුල වශයෙන් බෙදිල ඉන්නවා. නමුත් දෙමළ ජනතාව වශයෙන් ගත්තොත් ඒ අය සියයට 90 ක් පමණ එකට එක්කාසු වී සිටින බව අමතක කරන්න එපා.

මේ රටේ සියලුම පක්ෂවලටත් මේ රටේ සියලුම පක්ෂවලට සහයෝගය දක්වන ජනතාවටත් මේ අවස්ථාවේ මේ ගරු සභාව තුළින් මම ආයාචනයක් කරනවා. මෙය අපිට එකමුතු වන්නට වැදගත් අවස්ථාවක්. මේ අවස්ථාවේ අපි පටු හැඟීම් තුළින් දේශපාලන වාසි බලා අපි ඉදිරියට යන්නට උත්සාහ කළොත් ඒ නිසා දේශපාලන පක්ෂවලත් අපේ ජාතියේත් ඉතාම අවදානම් තත්ත්වය ළඟදීම උදවන බවට අනතුරු ඇඟවීමක් කරන්න කැමතියි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ලක්ෂ්මන් ජයකොඩි මහතා) එක ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න මම කැමතියි. " අපි එක්කාසු වෙන්නට හදන විට තමුන්නාන්සේලා ඉඩ දෙන්නේ නැහැ " යයි එතුමා කියනවා. උදාහරණයක් හැටියට කිව්වා, " හමුදාවට බඳවා ගත් අයගේ නම් කපනවා " කියා. එය වැරදි ආකල්පයක්.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඩබ්ලිව්. පී. කීර්තිසිංහ, හපුගහගම, දිවුලපිටිය. මොකද නොගත්තේ ?. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිසා. ඔහු ලංකාවේ සිටින දක්ෂතම කලාකාරයෙක්.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මගේ ආසනයේ නම් මොන පත්වීමක් ගැන හෝ මට නමක් එව්වොත් මම ඒ නම කපන්නේ නැහැ. කිසිම දේශපාලන සංවිධානයකින් අහන්නෙත් නැහැ. මම නිර්දේශ කර යවනවා. ඒ කටයුතු කරන්නේ පොලිසිය. ග්‍රාම සේවක මහත්වරු ආදීන්. ඒ රහස් සොයන්නේ ඒ අයයි. දේශපාලන වශයෙන් කිසිම කෙනෙකුගේ නම් අප කපන්නේ නැහැ. [බාධා කිරීමක්] එම නිසා, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතක් කරන්නට සතුටුයි, ජාතියම එක්කාසු කරවන්නට ගරු ශ්‍රීමත් ජනාධිපතිතුමා අවස්ථා කිහිපයකදීම පියවර ගෙන තිබෙන බව. ඉදිරියටත් එසේම පියවර අරගෙන යනවා.

ගරු කථානායකතුමනි, ගුරු පත්වීම් දීමේ වැඩ පිළිවෙළේදී ක්‍රියා කර ඇති ආකාරය තමුන්නාන්සේ දන්නවා ඇති. ඉල්ලුම් පත් කැඳෙව්වා, විභාගයක් තිබ්බා. මන්ත්‍රීවරුන්ගෙන් අහන්නේ නැතුව ඒ අයට පත්වීම් දුන්නා [බාධා කිරීමක්]

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ලැයිස්තු එවන්නටය කියා ඉල්ලා සිටියේ නැද්ද ?

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

එහෙම කිව්වේ නැහැ. තමුන්නාන්සෙ නොදැනයි කථා කරන්නේ. එසේ එවනවාට අපි විරුද්ධ වුණා. එවන්නට උපාය කියල අපි ඉල්ලා සිටියා. කරුණාකර කරුණු හරිහැටි තේරුම් ගන්න. ගුරුවරුන්ට උසස්වීම් දීමේදී අනුගමනය කළ සාධාරණ ප්‍රතිපත්තිය අපි අගය කළා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

තමුන්නාන්සේලා ළඟ කිසිම සාධාරණ ප්‍රතිපත්තියක් නැහැ.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

තමුන්නාන්සේ දන්නා සාධාරණ ප්‍රතිපත්තියක් නැහැ.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

ඉස්පිරිතාලවලට සනීපාරක්ෂක කම්කරු තනතුරුවලටත් ඇඟිලි ගැහුව්වා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

මෙයට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මගේ කථාව අවසන් කරන්නට පෙර සියලුම දේශපාලන පක්ෂවලින් මා ඉල්ලීමක් කරනවා, මේ රටේ අනාගත පරම්පරාව ගැන, සියලුම ජාතීන් ගැන තැවත වරක් සිතා බලන ලෙස. මෙසේ සිතා බලා පටු අදහස්වලින් ටිකක් ඇත්වී මේ ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලබා දීම පිණිස ක්‍රියා කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

එහෙම නම් වැඩ වර්ජනයෙන් අස් කළ අයට—කම්කරුවන්ට—ආපසු රක්ෂාව දෙන්න.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

වැඩ වර්ජනය කළ බොහෝ දෙනෙකුට ආපසු රක්ෂා දී තිබෙනවා. ඉතිරි අයටත් රක්ෂා ලබා දෙන්නට ප්‍රතිපත්තියක් හැටියට අප තීරණය කර තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

කම්කරු අමාත්‍යාංශයේ කටිටියට දෙන්නකො !

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)

උඩරට දෙමළ කම්කරුවන් වැඩ වර්ජනය කළාම වැඩිපුර රුපියල් දහයක් දුන්නා. සිංහල කම්කරුවන් වැඩ වර්ජනය කළාම ගෙදර යැව්වා.

එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා
(திரு. எம். ஜோசப் மைக்கல் பெரேரா)
(Mr. M. Joseph Michael Perera)

කම්කරු අමාත්‍යාංශයේ හුඟ දෙනෙකුට රක්ෂා දී තිබෙනවා, තව ටික දෙනෙකුටයි දෙන්නට තිබෙන්නේ. ඒ ටිකටත් දෙන බව මතක් කරමින් මට කථා කරන්නට අවස්ථාව දුන් තමුන්නාන්සේට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

අ. භා. 2.50

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු කථානායකතුමනි, පසුගිය සතියේ අහහරුවාද, අනුරාධපුරයේ සිදු වුණු ඛේදවාචකය සිතාමතාම සැලැස්මක් සහිතව ක්‍රියාත්මක වූ විනාශයක්ය කියන දේ පිළිබඳව කිසි සැකයක් නැති බවට මේ වන විට කරුණු පැහැදිලි වී තිබෙනවා. ඒ සිද්ධිය ගැන මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් පමණක් නොවෙයි, මන්ත්‍රීවරුන් හැටියටත් අපත් කණගාටු වෙන්නට ඕනෑ. විනාශයට පත් වුණු ජනතාව ගැන පළ කරන ශෝකයට අපේ ශෝකයත් එකතු කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

එපමණක් නොවෙයි. අනුරාධපුරය අපේ රටේ ජනතාවගේ සිතුම් පැතුම් තුළ අති විශේෂ ස්ථානයක් ගන්නා තැනක්. මේ රටේ අති මහත් බහුතර ජනතාව වූ බෞද්ධ ජනතාවගේ අති උත්තම ශ්‍රී මහා බෝධීන් වහන්සේ තිසා එහි ආගමික මෙන්ම සංස්කෘතිකමය සම්බන්ධය සහ පදනම අපේ රටේ අස්සක් මුල්ලක් නැර සැම තැනකටම බැඳී පවතිනවා. එම තිසාම එහි ඇති වුණු ඒ බෙදවාචකය අත් සියලුම බේදවාචකවලට වඩා ජනතාව උසි ගැනීවීමකට හෝ ජනතාවගේ වේදනාව වැඩි කිරීමකට හේතු වන බව අපට පැහැදිලිව පෙනුණා. සංඛ්‍යාත්මක වශයෙන් ගත් කළ පසුගිය දස වසර තුළ මේ රටේ සිදු වුණු විශාලතම ඝාතනය තමයි අනුරපුර ඝාතනය. නමුත් අද වනතුරු එහි සිදු වුණු විනාශයේ වගකීම භාර ගන්නට රජයේ කිසිම අංශයකට බැරිව සිටිනවා. දැන් හත් දවසකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. ආණ්ඩුවේ කිසිම කෙනෙක් මේ සිදු වීම ගැන, තම තිල බලයේ වගකීම භාර ගන්නට බැරි පසුබැමකට පත් ව තිබීමයි මෙහි ඉතාමත්ම කණගාටුදායක තත්ත්වය. ඇමතිවරු 98 දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා.—කැබිනට් ඇමතිවරු, දිස්ත්‍රික්ක ඇමතිවරු, විවධ ආකාරයේ ඇමතිවරු ඉන්නවා.— නමුත් මේ කිසිම කෙනෙක් මේ සිදු වූ වැරැද්ද පිළිබඳ වගකීම භාරගෙන, තමන්ගේ හිතට එකඟව ඒ වගකීම භාරගැනීම තිසා ඉල්ලා අස්වීමට සිදුවෙනවා නම් රටේ ඉදිරි ගමන් සඳහා එවැන්නක් පවා කරන්නට ලැස්ති වියයුතු වුවත් එසේ කෙරෙන්නේ නැති තත්ත්වයක් අද තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අද හමුදාව හෙල්ලිලයි ඉන්නෙ. පොලීසිය හෙල්ලිලයි ඉන්නෙ. මේ රටේ ආරක්ෂක බලකායන් සියල්ල හෙල්ලිලා සිටින මෙවැනි අවස්ථාවකදී ඒවාට නව ප්‍රාණයක් දීමට හැකිවෙන්නෙ ඒ වගකීම භාරගැනීමට හැකි උදවිය එය භාරගෙන තමන් අනුගමනය කළයුතු පිළිවෙත පිළිබඳව ක්‍රියාත්මක වීමෙනුයි. අපි දන්නවා, 1983 බේදවාකය සිදුවෙන විට, රටේ කලබල ඇති වූ අවස්ථාවේදී හිරගෙදර විශාල වශයෙන් ඝාතනයක් සිදුවුණු බව. අධිකරණ ඇමතිවරයා ඒ වගකීම භාරගෙන අරගත් පියවර මොනවාද කියාවත් අපි ප්‍රශ්න කරන්නට ඕනෑ. අද එය සියයට දහතින් වැඩිවි දෙසියයකට අධික ප්‍රමාණයක් මේ රටේ සාමාන්‍ය ජනතාව ඝාතනය කර දැම්මාට පසුව එහි වගකීම භාරගැනීමට කෙනෙක් නැහැ. ඒ පිළිබඳව විශාල වගකීමක් තිබෙන ජාතික ආරක්ෂක ඇමතිවරයා ඒ වගකීම භාරගෙන තමාගෙන් අඩුපාඩුවක් සිද්ධවුණාය, එහෙමත් නැත්නම් තමන් යටතේ සිටින නිළධාරීන්ගෙන් අඩුපාඩුවක් සිද්ධවුණාය කියා කියන්නටවත් ලැස්ති නැහැ. අමැතිවරයා කියනවා මේක සාමූහික වගකීමක්ය කියා. එසේ නම්, මුළු කැබිනට් මණ්ඩලයම මෙහි වගකීම භාරගන්නට ඕනෑ. ඇයි අපි එසේ කියන්නෙ ? පුද්ගලයකුට, පුද්ගලිකව පහර දීම සඳහා නොවෙයි, මම මේ ප්‍රශ්නය නැගුවේ. කිහිප වතාවක් අපි මේ ගරු සභාවේ සිට, මේ පාර්ලිමේන්තුවේ සිට, මේ ප්‍රශ්නය නගා තිබෙනවා.

ආරක්ෂක බලකායයන් මේ තත්ත්වයන්ට සූදානම් කිරීමක් එසේ නැත්නම්, මේ රටේ සාමාන්‍ය ආරක්ෂක තත්ත්වය රැකගැනීමේ හැකියාව ලබාදීම සඳහා සැළසුම් කිරීමක් තිබෙනවාද කියා අපි අසා තිබෙනවා. බොහොම ලස්සන වචනවලින් ආණ්ඩුව අපට කියනවා, "ත්‍රස්තවාදය ඉවත් කිරීම සඳහා අවශ්‍ය පියවරවල් ගෙන ඉදිරියට ගමන් කරනවා" ය කියා. 1980 දෙසැම්බර් මාසයේ 31 වැනිද වන විට ත්‍රස්තවාදය නැවත එන්න ශේෂයක්වත් නැතිව, මුලිනු'පුටා දමන්නය කියා යාපනේට පිටත් කර යැව්වා, බ්‍රිගේඩියර් වීරතුංග මහත්මයාව. 1980 දී, එනම්, අදට අමුරුදු පහකට පෙර, ජනාධිපතිතුමා කළ ඒ ප්‍රකාශනය අරගෙන බලන්න. අපි දන්නවා, ඔහු යාපනෙන් අපාසු පැමිණියා ත්‍රස්තවාදය මුලිනුපුටා දමා ! ඊට පසුව ඔහුව හමුදාපති කළා. මේ ලඟදී ඔහුව උසස් කළා ත්‍රිවිධ හමුදාවල ප්‍රධානයා හැටියට. මම වීරතුංග මහත්මයාට පුද්ගලිකව බැතින්නෙ නැහැ, මම කියන්නෙ වගකීම පිළිබඳ ප්‍රශ්නය, රටේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය, මහජනතාවගේ ජීවිත එදිනෙද පවත්වාගෙන යාම පිළිබඳ ප්‍රශ්නය ක්‍රමානුකූලව පාලනය කර ගන්නට බැරි තත්ත්වයකට රාජ්‍ය පාලනය වැටුණාට පසුව ඇති වන අරාජිත තත්ත්වය රටේ ඉදිරි ගමනට, ප්‍රගතියට, උදව්වක් වෙන්නෙ නැහැ කියන එකයි. අපි අමුතුවෙන් ඒ ගැන තර්ක කරන්නට වුවමනා නැහැ. ඒකයි අද සිද්ධවෙලා තිබෙන්නෙ.

අපි සිද්ධියෙන් සිද්ධිය අරගෙන බලමු. අනුරාධපුරයේ සිද්ධිය වෙන්නට කලින් වාවකච්චේරිය පොලීසියට ගහන සිද්ධිය, රජය කලින් දැනගෙන සිටියා. එය වැළැක්වීමට කිසිම පියවරක් අරගෙන තිබුණෙ නැහැ. පොලීසියට ගහලා විනාශ කළාට පසුව හදිසි නීතිය දික් කිරීම සඳහා මෙතැනට ඇවිල්ලා අවසර ඉල්ලනවා. කිලිනොච්චිය පොලීසියට ගහන ආරංචිය ආරක්ෂක බලකායවලට ලැබී තිබුණා. ඒක වළක්වන්නට පියවර අරගෙන තිබුණෙ නැහැ. නමුත් මේ සභාවට ඇවිල්ලා හදිසි නීතිය දික් කිරීමේ වරම ඉල්ලනවා. ඊටපසුව මැදවච්චියට ගැහුවා. මැදවච්චිය පිළිබඳ ආරංචිය මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) මැදවච්චියට පහර දෙන්නට කලින් මේ ගරු සභාවේ ඉදිරිපත් කළා. කන්තලේ හා ඒ අවට ප්‍රදේශවලට මේ වාගේ තර්ජනයක් පවතිනවා කියා ඒ අවස්ථාවේදී එතුමා කිව්වා. ඒවා එසේ සිදුවෙද්දී තමුන්නාන්සේලා විපක්ෂයෙන් උදව් ඉල්ලනවා. අපි කී දේවල් තුටටුවකටවත් ගණන් ගත්තා නම් ඒ තත්ත්වයන් මැඩපැවැත්වීම සඳහා යම්කිසි පියවරක් ගන්නට තිබුණා ; නමුත් ගන්නෙ නැහැ.

ප්‍රදේශයෙන් ප්‍රදේශයට පහර දෙමින් ආරක්ෂක බලකායේ අය මරු මුවට පත් කරමින්, සාමාන්‍ය ජනයා මරුමුවට පත් කරමින්, ඒ තිසාම ඒ ප්‍රදේශවල ජීවත් වන දුවිඩ ජනතාව ද අතිවාර්යයෙන්ම මරණයට ලක් වන අන්දමේ අවුල් සහගත තත්ත්වයකට රටේ මේ ප්‍රදේශ ගණනාවම පත් වී තිබෙන්නේ ආරක්ෂක බලකායවල ප්‍රධානීන්ගේ වගකීම ඉෂ්ට නොකිරීම තිසයි කියා මම අද මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් ආණ්ඩුවට චෝදනා කරනවා. තර්කානුකූලව තමුන්නාන්සේලා කිසි කෙනෙකුට ඒ වගකීමෙන් මිදෙන්නට බැහැ. ඒ තිසයි මේ තත්ත්වය ඇති වුණේ.

අනුරාධපුරයට තිබුණු තර්ජනය පිළිබඳව මීට කලින් කියැවුණා. අනුරාධපුරයට තිබුණු තර්ජනය රජය දැන ගෙන සිටියා. අනුරාධපුරයට පහර දෙන ලකුණු තිබෙන බවට ආරංචි කල් ඇතිව හොඳටම තිබුණා. ඒ බව කලවානේ ගරු මන්ත්‍රීතුමාත් කිව්වා. සමහර අය අත් අඩංගුවට ගත්තා. ඒ අයගෙන් ප්‍රශ්න කළා. කරුණු දැන ගත්තා. ඒ අනුව පියවරවල් ගත්තා යයි කියනවා. පසුගිය මාසයේ 29 වන ද 'සන්' පුවත් පතේ පැහැදිලිව මේ විධියට කියා තිබෙනවා.

I quote "The Sun" newspaper of 29th April, 1985 :

"TIGHT SECURITY IN ANURADHAPURA

A tight security umbrella was laid over the city of Anuradhapura yesterday following information that terrorists are planning an operation in the area.

Reports said roadblocks have been set up at all entry points to check vehicles entering and leaving the city, while several roads leading to the heart of the city have been closed to vehicular traffic.

A senior government official told SUN that pilgrims to the sacred city may have to undergo certain difficulties, which will prevail till the terrorist threat is over. 'We have been compelled to impose these regulations to protect the lives and property of the people in the area', he said.

SUN learnt that the new regulations were discussed at a top level meeting held at the Anuradhapura kachcheri last morning. It was atended by the District Minister for Anuradhapura Chandra Bandara, Government Agent T. K. Dissanayake, the Superintendent of Police Ratnasiri Herath and several other top officials.

Police sources said, the new security regulations follow the arrest of a terrorist suspect two days ago who review that terrorist had plans to strike in Anuradhapura."

මේක සාමාන්‍ය ජනතාව විතරක් නොවෙයි දක්කේ. ආරක්ෂක අංශවල හැම කෙනෙක්ම දකින්නට ඕනෑ. පුවත්පත් දකින්නට ඕනෑ. තමන්ගේ අංශ ගැන ප්‍රශ්න කළ විට සැපයූ තොරතුරු තමන්ට ලැබෙන්නට ඕනෑ. අනුරාධපුර දිස්ත්‍රික්කය භාරව ගරු ඇමතිවරයෙක්, දිස්ත්‍රික් ඇමතිවරයෙක් ඒ සාකච්ඡාවේ ඉඳලා තිබෙනවා. අඩුම වශයෙන් එතුමා නෝ වාර්තා කරන්නට ඇති. මොකක්ද වෙලා තිබෙන වැරැද්ද ? ඊයේ " දිවයින " පත්‍රයත් සමග ජාතික ආරක්ෂක ඇමතිතුමා කළ පුවත්පත් සාකච්ඡාවකදී යම් යම් අවහිරකම් ගැන එතුමා කියා තිබෙනවා. ආරක්ෂක හේතුන් උඩ, අනුරාධපුරය නගරය ආරක්ෂා කරන්නට ගත් යම් යම් පියවරවල් ඉහලින් ලැබුණු නියෝග අනුව අවලංගු කර දමන්නට සිදු වුණය කියා එතුමා කියනවා. කැබිනට් ඇමතිවරයෙකුට වඩා ඉහළින් ඉන්නේ කවුද ? ගරු ඇමතිතුමා මේ පිළිබඳව මේ ගරු සභාවට උත්තරයක් දෙනවා නම්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රකාශයක් කරනවා නම් හොඳයි. අප දන්නා විධියට කැබිනට් ඇමතිවරුන්ට ඉහළින් ඉන්නේ ජනාධිපතිතුමා විතරයි. අනුරාධපුර නගරය ආරක්ෂා කිරීම සඳහා ගත් පියවරවල් අයින් කරන්නය කියා ජනාධිපතිතුමා නියෝගයක් දුන්නාද ? එහෙම නියෝගයක් දී නැහැයි කියා මම විශ්වාස කරනවා. ඒකාබද්ධ ආරක්ෂක මණ්ඩලය—ජොයින්ට් ඔපරේෂනල් කවුන්සිල්—කියා එකක් තිබෙනවා. ඒකෙන් නියෝගයක් දුන්නාද කියා ගරු ඇමතිතුමා කියනවා නම් හොඳයි. ඇයි ? නගරයේ ආරක්ෂක වැඩ පිළිවෙළ ඉවත් කරන්නට සිදු වුණේ ඉහළින් ලැබුණු නියෝගයක් පිටය කියා ගරු ඇමතිතුමාම පිළිගන්නවා. එහෙම නම් අනුරාධපුර පහරදීම සිදු වුණේ රජයේ අයගේම තීරණයක වැරදිනාවය නිසාය කියා කිසිම සැකයක් නැහැ. ඒ වගකීම ඇමතිතුමා භාර ගන්නට ඕනෑ. ඉහළින් ලැබුණු නියෝග ගැන කථා කරලා ප්‍රශ්නයෙන්, වගකීමෙන් බේරී යන්නට බැහැ. ගරිල්ලා හෝ ත්‍රස්තවාදී ප්‍රහාරයක් හදිසියේ කෙනෑගින් මතු වෙනවාද කියා කිසි කෙනෙකුට කියන්නට බැහැයි කියා ගරු ඇමතිතුමා අද සමහර විට තර්ක කරන්නට පුළුවන්. ඒක අපිත් පිළිගන්නවා. යුද්ධමය වශයෙන් බලන විට කවුරුත් එය පිළිගන්නා දෙයක්. නමුත් මතු වුණාට පසුව ගත්ත පියවරවල් මොනවාද ? එහි විනාශය වැළැක්වීම සඳහා ගත්ත පියවරවල් මොනවාද ? අන්න ඒ මත තමයි, ආරක්ෂක බලකායයන් ක්‍රියාත්මක වීම පිළිබඳව හරියාකාර තක්සේරු කරන්න පුළුවන් වන්නේ.

අනුරාධපුරයේ එවැනි තත්ත්වයක් ඇති වී නැහැ. ඔවුන් පටන් ගත් තැන සිට අවසානය දක්වා ඔවුන්ට අවශ්‍ය සියලු දේ කරගෙන නිදහසේ ගිය බවට කිසිම සැකයක් නැහැ. රාත්‍රියේ එලුවන්කුලමේ නවතා තිබුණු බස් රථයක් අරගෙන අනුරාධපුර බස් තැවතුම් පොළට ඇවිත් තමන්ට රිසිසේ මහජන ජීවිත, මහජන දේපොල විනාශයට පත් කරන්ට ඔවුන්ට පුළුවන් වුණා. ඒ වගේම සමහර කඩවල්වලට ගොස් ඒ කඩ ඇතුළේ සිටි අයට තමා කියා අඩ ගසා වෙඩි තබා මරා දමා එක බස් රථයක් විනාශ කර තවත් බස් රථයකට නැග එම බස්රථය ඇතුළේ සිටි අය ඝාතනය කර, බස් රථය අරගෙන යන ගමන් මළ මිණි පාරට විසි කරන්න පුළුවන් වුණා.

ඒ අතරතුර තව ත්‍රස්තවාදීන් පිරිසක් — බස් රථයකට වඩා අඩු වේගයෙන් වෙන්න ඕනෑ — පාර දිගේ ඇවිද ගෙන යාමට, කඩ විදිය පසු කරමින් පාගමනින් ඇවිදීමට ගත කළ කාල සීමාව තුළ ආරක්ෂක බලකායයන්ට මෙම පණිවුඩය ලැබුණේ නැහැයි කියනවා නම් එය පිළිගන්න බැහැ. පණිවුඩය ලැබෙන්න ඇති. කීප දෙනෙක්ම දුරකථන මගින් පොලිසියට මේ පිළිබඳව දැනුම් දී තිබෙනවා. අටමස්ථානයේ ආවාසයේ කාර්යාලයෙන් දැනුම් දුන්නා, " නගරයේ වෙඩි පිටවෙනවා, අපේ ආරක්ෂාවට එන්න කියා. යුද හමුද කඳවුරට දැනුම් දුන්නා. පොලිස් ස්ථානයට දැනුම් දුන්නා. දැන් එනවා, දැන් එනවා. " කිව්වා මිසක් ඒ තත්ත්වයට මුහුණ දීමට කවුරුත් පැමිණියේ නැහැ.

ගරු කථානායකතුමනි, පසුගිය සෙනසුරාද, මමත් අනුරාධපුරයට ගියා. මොකද ? මේ තත්ත්වය සැබැවින්ම ඇස් දෙකෙන්ම දැක බලා ගන්නත්, රජයේ ප්‍රකාශනවලින් කියන දේවල් ඇත්තද කියා බලාගන්නත් මම එහි ගියා. පළමුවෙන්ම රජය කිව්වේ මුළු මහත් වැඩකටයුතු ටික සිදුවෙන්න ගතවුනේ විනාඩි 20 ක පමණ කාලයක්ය කියලයි. එහි අසත්‍ය බව ඔප්පු වුණාට පසුව එම වෙලාව දික් කළා. මෙම සම්පූර්ණ ක්‍රියාදමය හමාර කරන්නට විනාඩි 45 ක් පමණ කාලයක් ගත්වී තිබෙන බව පැහැදිලියි. මේ ක්‍රියාදමය සිදු කර තිබෙන්නේ සැලැස්මක් සහිතවයි. ඔවුන්ට අවශ්‍ය මූලික විනාශයත් සිදු කර ගියාට පසුව තමයි ආරක්ෂක බලකායයන් එතැනට ඇතුල් වුණේ. මෙන්න මේ තත්ත්වය නිසා මා තැවතත් අහන්නෙ මෙයයි. තමුන්නාන්සේලාගේ ආරක්ෂක බලකායයන් යොමු කරන්නේ කුමන කරුණක් සඳහාද ? කුමන කටයුත්තක් සඳහාද ? පහරදීමකදී ඇතිවෙන තත්ත්වය අනුව යම්කිසි පසුබෑමක් සිදුවෙන්න පුළුවන්. නමුත් කොතැනදී හෝ එයට මුහුණදීම පිළිබඳව ශක්තියක් තිබෙන්න ඕනෑ. අපේ පොලිස් හටයෙකුට හෝ යුද හමුද හටයෙකුට කිසිම විටෙක මම තමා මේ පිළිබඳව චෝදනා කරන්නේ නැහැ. ඔවුන් මේ රටේ ආරක්ෂාව සඳහා කැපවීමකින් යුතුව කටයුතු කරනවා. ඒ විධියේ කැපවීමක් ඉහළ පෙළේ සිටින කිසිවෙකුගෙන් සිදු වෙන්නේ නැහැ. ඔවුන් විදින දුක පිළිබඳව, ඔවුන් කරන පරිත්‍යාග පිළිබඳව හැඟීමක් නැති අය තමයි ඉන්නේ.

අද වතුරු ජාතික ආරක්ෂා ඇමතිතුමා අනුරාධපුරයට ගියේ නැහැ. එතුමා 1985 පෙබරවාරි මාසයේ 22 වැනිද කොත්මලේ මන්ත්‍රීතුමාට අභියෝගයක් කළා. එතුමා කොත්මලේ මන්ත්‍රීතුමාට කිව්වා, උතුරේ ඔහුම තැනකට එතුමාත් සමග යන්න බය නැතුව එන්නය කියා. හෙලිකොප්ටරයකින් එක්ක යන්නම් කිව්වා. ඇයි ඔය හෙලිකොප්ටරයෙන් අනුරාධපුරයට ගියේ නැත්තෙ ? එතුමාට අවම යුතුකමක් තිබෙනවා, අංශ ප්‍රධානියා හැටියට ඇමතිවරයා හැටියට, ඒ ස්ථානයට යන්න. ඇමතිතුමා ඒ ස්ථානයට ගියා නම්, ගියා කියල කියාවි. සුමානයකට පසුවවත් තමුන්නාන්සේලාට එහි යන්න බැරි වී තිබෙනවා. තමුන්නාන්සේලා යන දවසට එහි හුඟාක් දේවල් විනාශ වෙලා තියෙයි. එදට තමුන්නාන්සේලා ගිහින් බලයි. මම කියන්නේ මෙයයි. මේ ආරක්ෂක තත්ත්වය ජාතික ආරක්ෂක ඇමතිතුමා දැනගෙන සිටියා. එසේ නැතිනම් ආරක්ෂක මණ්ඩලය දැනගෙන සිටියා. මීට දවස් තුනකට ඉස්සෙල්ලා කැකිරාවේ මහපොළ පැවැත්තුවා.

එච්. එම්. ඒ. ලොකුබණ්ඩා මහතා (ගල්ගමුව)
(திரு. எச். எம். ஏ. லொக்குபண்டா — கல்கமுவ)
(Mr. H. M. A. Lokubandara–Galgamuwa)

ගරු කථානායකතුමනි, මහරගම ගරු මන්ත්‍රීතුමා වැරදි ප්‍රකාශයක් කළා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

[බාධා කිරීම්] අනුරාධපුරය දෙස බලබලා කැකිරාවේ මහපොළ තිබ්බා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please !

එච්. එම්. ඒ. ලොකුබණ්ඩා මහතා
(திரு. எச். எம். ஏ. லொக்குபண்டா)
(Mr. H. M. A. Lokubanda)

ගරු කථානායකතුමනි, කරුණාකර කතා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්]

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

[බාධා කිරීම්] ඒ අවස්ථාවේදී මේ ත්‍රස්තවාදය පිළිබඳ විග්‍රහයක් කළා.

එච්. එම්. ඒ. ලොකුබණ්ඩා මහතා
(திரு. எச். எம். ஏ. லொக்குபண்டா)
(Mr. H. M. A. Lokubanda)

ගරු කථානායකතුමනි, [බාධා කිරීම්].

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! Hon. Member for Galgamuwa.

එච්. එම්. ඒ. ලොකුබණ්ඩා මහතා
(திரு. எச். எம். ஏ. லொக்குபண்டா)
(Mr. H. M. A. Lokubanda)

අනුරාධපුරයට අපි කවුරුවත් ගියේ නැත කියා මහරගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අනුරාධපුරයේ සිද්ධිය දැනගත් වෙලාවෙම මම එහි ගියා. පැය දෙකක් ඇතුළත් මම ගියා. ඒ නිසා එතුමා කළ ප්‍රකාශය කරුණාකර ඉල්ලා අස්කර ගන්න. ඒක වැරදි ප්‍රකාශයක්. සිද්ධිය වුණු වෙලාවෙම අපි ගියා. එදම ගියා. මහරගම මන්ත්‍රීතුමා හිතනවා ඇති එතුමා විතරයි ඒවට යන්නේ කියා. තමුන්නාන්සේ ගියේ සුමානයකට පස්සේ. අපි සිද්ධිය වුණු වෙලාවෙම ජීප් එකෙන් ගියා. බොරු ප්‍රකාශ කරන්න එපා. තමුන්නාන්සේ හිතනවා ඇති තමුන්නාන්සේ විතරයි සිංහල කියල. අපි වෙනත් ජාතියක මිනිසුන් කියා. වෙනත් ආගමක මිනිසුන් කියා.

විමලා කන්නන්ගර මහත්මිය (ග්‍රාම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමිය)
(திருமதி விமலா கன்னங்கர — கிராம அபிவிருத்தி அமைச்சர்)
(Mrs. Wimala Kannangara–Minister of Rural Development)

අපි කවුරුත් ගියෙ නැහැයි කිව්ව. ගම්පහ දිසා ඇමතිතුමාත්, නියෝජ්‍ය සොබ්‍ය ඇමතිතුමාත්, මමත් ගියා. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේලාගෙන් සමහර අය යන්න ඇති ගාමිණී දිසානායක ඇමතිතුමා ගිය බව මුළු රටටම පෙන්නුවා. ඒ ගැන කිසි සැකයක් නැහැ. ඇමති මණ්ඩලයේ ඇමතිවරයෙකු ගිය බව මුළු රටම දැනගත්තා. ඒවාගේම ජාතික ආරක්ෂක ඇමතිතුමා ගියා නම්, ජනාධිපතිතුමා ගියා නම්, අගමැතිතුමා ගියා නම් ආණ්ඩුවේ වෙනත් ප්‍රධානියෙක් ගියා නම් රටේ ජනතාවට ඒ බව කියනවා. ඒ තුළින් තමයි රටේ ජනතාව වැටී තිබෙන වේදනාවෙන්, ඔවුන් මුදවාගෙන රටේ ජනතාව පත් වී සිටින බියෙන් ඔවුන් නිදහස් කරගෙන ඔවුන් පණගන්නවා ඔවුන් තුළ ආත්ම ධෛර්යයක් ඇති කරන්න පුළුවන් වන්නේ. සටනක් දියත් කරගෙන ඉදිරියට යනොත් ඒ සටනට නායකත්වය දෙන අය හැසිරෙන්නට ඕනෑ ඒ අන්දමටයි. නායකත්වය දෙන අය පසු පෙළ ඉදගෙන ප්‍රකාශ නිකුත් කිරීමෙන් පමණක් සටනකට නායකත්වය දෙන්න කාටවත් පුළුවන් වන්නේ නැහැ.

මම කියාගෙන ආවේ මෙයයි. මීට දවස් තුනකට ඉස්සෙල්ලා අනුරාධපුරය දෙස බල බලා කැකිරාවේ මහපොළ පැවැත්තුවා. ඒ අවස්ථාවේදී ත්‍රස්තවාදය සම්බන්ධයෙන් තමා ප්‍රකාශ කළේ කුමක්ද යන වග නැවත කල්පනා කරන ලෙස මම ජාතික ආරක්ෂක ඇමතිතුමාට කියනවා. ඒ විතරක් නොවෙයි. ඊළඟ සතියේදී අනුරාධපුරයේ මහපොළ තියන්න වැඩ ආරම්භ කරද්දී අනුරාධපුරයට ත්‍රස්තවාදී තර්ජනයක් තිබෙන බව තමුන්නාන්සේ හොදාකාර දැනගෙන සිටියා. එසේ දැන දැනත් දහස් ගණනක් එක්නැත් වන අනුරාධපුරයේ මහපොළ තියන්න දින තියම කළේ මොකද යන ප්‍රශ්නයයි මම තමුන්නාන්සේගෙන් අහන්නේ. තමුන්නාන්සේලාට මෙය තැහැයි කියන්න පුළුවන්ද ? අනුරාධපුරයේ සිද්ධිය සිදු වී දවස් තුනක් ගියාට පසුවයි අනුරාධපුරයේ මහපොළ අවලංගු කළේ. අද ආණ්ඩුව කියනවාද තමන්ට ලැබෙන තොරතුරු මහජන ජීවිත ආරක්ෂා කිරීම සඳහා හරියාකාර පාවිච්චි කරනවා කියා. එසේ පාවිච්චි නොකිරීම නිසා තමයි අනුරාධපුරයේ ඛේදවාචකය මේ ආකාරයට සිදු වුණේ.

" දිවයින " පත්තරයේ පළ වී තිබෙන ජාතික ආරක්ෂක ඇමතිතුමාගේ ප්‍රකාශ මම එකින්එක කියවන්න යන්නේ නැහැ. ඇමතිතුමා නැතැයි කී කොටස පමණක් මම කියවනවා. එතුමා කියා තිබෙන්නේ " මට තිබෙන බලතල මොනවාද කියා ගැසට් පත්‍රයෙන් බලන්න " කියායි. තමුන්නාන්සේට බලතල නැත්නම් එය තමුන්නාන්සේ ප්‍රසිද්ධියේ කියනවා නම් මේ ආරක්ෂක තත්තවයේ අවුල රටේ ආරක්ෂක යහපත සඳහා විසඳෙයි. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආතන්ද දසනායක මහතා) මීට විවාද දෙකකට පෙර ගැසට් පත්‍රය ගැන මතක් කරන විට එතුමාගේ තර්කයට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හිනා වුණා. මට මතකයි. දැන් ඇමතිතුමා කියනවා, " මට තිබෙන බලතල අනුවයි මම ක්‍රියා කරන්නේ " කියා. ඇත්ත වශයෙන්ම ඇමතිමාට බලතල නැත්නම් මේ පිළිබඳව වගකියන්න ඕනෑ කවුද ? රටේ ආරක්ෂක තත්ත්වය ගැන කවුද වගකියන්න ඕනෑ ? මම ප්‍රශ්න කරන්නේ ඒකයි.

මේ විනාශය සිදු වුණු ස්ථාන ගණනාවක් තිබෙනවා. ත්‍රස්තවාදීන් මේ පාරවල් දිගේ ගමන් කරමින් කීප තැනක නවත්වමින් විල්පත්තුවට හැරෙන හන්දිය දක්වා හැතැප්ම 18 ක් පමණ ගමන් කරමින් එහි සිට ඔවුන් ගමන් කළ ආකාරය පිළිබඳව විග්‍රහය මම නොකිව්වාට රජයටත් රටටටත් පැහැදිලි වී තිබෙනවා, විල්පත්තු අභයභූමියේ සේවය කරන ඊබ්‍රහම් මහතාගේ ප්‍රකාශවලින්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! The Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයේත්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்ரம] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. EDMUND SAMARAWICKREMA] *took the Chair.*

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ත්‍රස්තවාදී ප්‍රහාරකයන් පාරදිගටම අහු වුණු—අහුවුණු තැන ඝාතනයන් සිදු කරමින් ශ්‍රී මහා බෝධීන් වහන්සේට, පහළ පරිවාර බෝධීන් වහන්සේලාට පැහැදිලිව වෙඩි තබා තිබෙනවා. ඒ අවට වෙඩි උණ්ඩ සලකුණු ඕනෑ තරම්—සිය ගණන්—තිබෙනවා. ලේ තැවුරුණු බිත්ති අදත් ඕනෑ තරම් දකින්න තිබෙනවා. එතැන භාවනා කරමින් සිටි භික්ෂූන් වහන්සේ නමකුත් ඝාතනය කළා. ඒ විධියට විශාල පිරිසක් ඝාතනය කළා. ඒ විධියට දරුවන් ඝාතනය කළා ; කාන්තාවන් ඝාතනය කළා ; මෙසේ විශාල පිරිසක් ඝාතනය කර තාප්පයට උඩින් පැන ගිය මේ ත්‍රස්තවාදීන් ආපසු මිරිසවැටිය පැත්තට, පුත්තලම් පාරට අරගෙන යන්න ඔවුන් ආ බස් රථය ආ තැනින් වටේ ඇවිල්ලා අවශ්‍ය තැන නවත්වා තිබෙනවා. එතැනින් නැවතත් ඒ බස් රථයට නැඟී දිගටම වෙඩි තබමින් තමයි, මොවුන් ගිහින් තිබෙන්නේ.

ඒ විධියට නොච්චියාගමට ඇවිත් එහි සුළු මුහුණ දීමක් ඇති වී නැවත ඉදිරියට ගිහින් පාර වැරදී හැරී ඇවිල්ලා තමයි, විල්පත්තුවට ගිහින් තිබෙන්නේ. එතැන ඉඳලා මරදන්මඩුව කියන ස්ථානයට යන තුරු විල්පත්තු අභය භූමිය ඇතුළේ වර්ග සැතපුම් 500 ක් පමණ තිබෙනවා. ඒ අභය භූමිය ඇතුළේ මහ පාරේ වගේ සාමාන්‍ය වේගයෙන් ගමන් කරන්න බැහැ. වැලි පාරක ගමන් කළ යුත්තේ හෙමිනුයි. ඒ නිසා ජීප් රථය වේවා, පසුව ඒ අය ගමන් කළ ට්‍රැක්ටරය වේවා ගමන් කළ වේගය බොහෝම අඩුයි. ඒ නිසා ඔවුන් ගමන් කළ ඒ වාහනවලට ඒ ගමන යන්න පැය ගණනාවක් ගත වෙනවා. ඒ පැය ගණනාව ඇතුළේ ඔවුන්ට විරුද්ධව යොදවන්න තමුන්නාන්සේලාගේ තිබුණේ එක හෙලිකොප්ටරයයි. කොටින්ම කියනවා නම් ත්‍රස්තවාදීන්ට වෙඩි තබන්න පාත් වෙන්න පුළුවන් තත්ත්වයේ තිබුණේ එක හෙලිකොප්ටරයයි තිබුණේ. ඒ පැය ගණනාව තුළ ඒ හෙලිකොප්ටරයට පුළුවන් උත්සාහයක් දරුවා, ත්‍රස්තවාදීන්ට වෙඩි තබන්න. තමුන් පසුව වෙඩි වැදීම නිසා ඒ හෙලිකොප්ටරයටත් ආපසු යන්න සිදුධ වුණා.

ආණ්ඩුව කියනවා ඊට පස්සේ ඒ ත්‍රස්තවාදීන් අතුරුදහන් වුණාය කියා. තමුන් ඊබ්‍රහම් මහතාගේ ප්‍රකාශයෙන් කියැවෙන්නේ මොකක්ද ?

This appeared in the Daily News of 20th May, 1985.

"At Maradammaduwa, the jeep lodged two wheels in loose earth, and a gang of labourers and department men who were working with Game Ranger Wilson came up to help.

"I tried to signal them away, but the terrorist beside me tapped my wrist down . . . We all got down, and our men joked as they walked up...

"Just then a helicopter was heard overhead"

සිතියමක් බැලුවොත් ඕනෑම කෙනකුට තේරෙනවා, මරදන්මඩුව තිබෙන්නේ නොච්චියාගමට කොපමණ දුරින්ද කියන එක. එහෙම නම් ඒ ත්‍රස්තවාදීන් නොච්චියාගමින් හැරී විශාල වේලාවක් ගත වුණාට පස්සේ, මරදන්මඩුව කියන ස්ථානයේදීයි පළමු වරට හෙලිකොප්ටරයක් ආවේ. ඒ කාලපරිච්ඡේදය තුළදී රාජ්‍ය ආරක්ෂාවේ තත්ත්වය මොකක්ද ?

ඊළඟට, අර ප්‍රකාශයේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා :

"...this was at Maradammaduwa where there is cover from the jungles and everyone was asked to crouch low."

එතැන ඉඳල කුදිරමලේ කියන ස්ථානයට යන්න තවත් පැය ගණනාවක් යනවා, ඒ පාරේම ගියත්. එහෙම නැත්නම් ගහෙන් එගොඩවෙලා මරිච්චිතඩි කියන ස්ථානයට ගිහින් එතැනින් මත්තාරම් පාරට යන්න පුළුවන්.

ජාතික ආරක්ෂක ඇමතිතුමා තවම කියනවා, විල්පත්තු අභය භූමියේ මේ ත්‍රස්තවාදීන් ඉන්නවාය කියා. ඇමතිතුමා කියන්නේ සම්පූර්ණයෙන්ම සත්‍යයක්යයි අපි හිතනවා. ඒ නිසා ඒ අය හොයා ගත්තොත් ඒක තමයි, විශාලම ජයග්‍රහණය. වර්ග සැතපුම් 500 ක මේ කැලෑ ප්‍රදේශයේ එකම එක පාරයි තිබෙන්නෙ. එහෙම නම් කැලෑවත් පාරත් අතර ඇති වෙනස අහසේ සිට බලන ඕනෑම කෙනෙකුට පේනවා. මේ පැය ගණනාවක් තුළදී ගත් ක්‍රියා මාර්ගයත් සුළු නිසා ඒ අයට යන්න තිබුණ අවස්ථා ගණනාවක් තුළින් ඔවුන් සිටිනවාද නැද්ද කියන එක එතුමා පමණයි දන්නෙ. මොකද ? එතුමාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරක්ෂක වළල්ලක් මුහුද වටේ තිබෙන නිසා. ඒ ආරක්ෂක වළල්ලට තවමත් ඔවුන් අසු වෙලා නැහැ. ඒ නිසා ආරක්ෂක වළල්ලෙන් එහාට යන්නත් බැහැ. මෙහා තමයි ඉන්න ඕනෑ. මෙහා ඉන්නවා නම් කොහේද ඉන්නේ කියන ප්‍රශ්නය එතුමාට භාර ප්‍රශ්නයක්.

මම මේ ටික කියන්නෙ මෙන්න මේ නිසයි. එතුමා ආරක්ෂක වළල්ලක් ඇති කළා. ඒ බව මේ සභාවට කීවා. ඊට පස්සේ වෙරළාසන්න ප්‍රදේශ ආරක්ෂක ප්‍රදේශ බවට පත් කළා. මේ සභාවට කියා අවසර ගත්තා. " වෙරළාසන්න ආරක්ෂක ප්‍රදේශ ඇති කර ඒවායේ ජීවත් වන අය ඉවත් කරනවාය ; ඒ ප්‍රදේශවල තවදුරටත් මේ තත්ත්වය ගෙන යන්න ඉඩ දෙන්නේ නැත " කිව්වා. ඊට පසුව උතුරට ගමන් කරන වාහන ආදිය පාලනය කිරීමට නීති සම්මත කළා. ඒ සියලු තත්ත්වයන් යටතේත් මේ කාර්‍යයන් බොහෝම හොඳට සිද්ධ වෙනවා.

ඒ අතරතුර ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමතියි, අනුරාධපුරයේ මේ සිද්ධිය වන වෙලාවේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාට දුරකථන පණිවුඩයක් ලැබුණාද නැද්ද කියා. ඒ ගැන ඇමතිතුමා පැහැදිලි ප්‍රකාශයක් කරනවා නම් හොඳයි. මම හිතන්නෙ බ්‍රිගේඩියර් වීරතුංග මහත්මයාගෙන් වෙන්න ඕනෑ. එතකොට අතපත්තු මහත්මයා මේ පණිවුඩය විල්පත්තුවේ කාර්‍යාලයට දුන්නේ කියටද කියලා සොයලා බලනවා නම් ආරක්ෂක කටයුතුවල තත්ත්වය හෝ ආරක්ෂක කටයුතු භාර නිලධාරීන් දෙන නියෝග කොයි තරම් දුරට සාමාන්‍ය නිලධාරීන් පිළිපදිනවාද, ගණන් ගන්නවාද ඒවට වග කියනවාද කියා හොඳට පැහැදිලි වේවි.

මෙන්න මේවා පිළිබඳව තමුන්නාන්සේ කාරණා දන්නවා. මම ඒ ගැන නැවත නැවතත් භාරන්නෙ නැහැ. සමහර විට විනාඩි කීපයකට කලින් දුන්නා නම් විල්පත්තුවට එන ත්‍රස්තවාදීන් පළවා හරින්න බැරි වුණත් එතන සිදු වුණ ඝාතනය නම් අඩු වෙන්න පුළුවන්කම තිබුණා. මේ තත්ත්වයන් යටතේ අපි අහන්නේ මේ ත්‍රස්තවාදී ක්‍රියා දමයන් මැඩලීම සඳහා තමුන්නාන්සේලා බලය වැඩි කිරීම තුළින් සිද්ධ කර තිබෙන දේ කුමක්ද කියායි.

මම තව එක ප්‍රශ්නයක් නගන්න බලාපොරොත්තු වෙනවා. අපි කවුරුත් දන්නවා, මේ පිළිබඳ පුවත ලෝකයට පළමුකොටම දෙන්න පටන් ගත්තේ බීබීසී හෙවත් බ්‍රිතාන්‍ය ගුවන් විදුලි සේවයෙන් කියා. ඒ ප්‍රකාශකයා පැහැදිලිව කීවා මේ ප්‍රකාශය නිකුත් කරන්නේ යාපනයේ සිටය කියා. ඒ නිලධාරියා හෝ ඒ ප්‍රකාශකයා යාපනයට ගෙන ගියේ කවුද කියා සොයා බලනවා නම් වඩා හොඳයි. ඔහු යාපනයේ සිටියේ කොතැනකද කියාත් සොයා බලනවා නම් වඩා හොඳයි. ඒ මොකද, ඔහු පළමුකොටම කිව්වා මෙය ප්‍රතික්‍රියාවක් හැටියට කළ පහර දීමක්ය කියා. ප්‍රතික්‍රියාවේ තත්ත්වය කුමක් වුණත් සැලැස්මක් සහිතව කල් තියා අනුරාධපුරයට ගහන්න සිටි බව පැහැදිලිව පෙනෙනවා. මම අහන්නෙ මේකයි ; බීබීසී නිවේදකයා යාපනයට ගෙන ගියේ කවුද ? ඔහු යාපනයේ සිටියේ කොතැනකද ? ඒ ගැන රජය සොයා බලා තිබෙනවාද ? ඒ ගැන සොයා බලා තිබෙනවා නම් ඒ කොතැනද කියා පැහැදිලි වන විට මම හිතන්නෙ ලංකාව පිළිබඳ ජාත්‍යන්තර මාර්ගවලට තිබෙන සම්බන්ධකම් හුඟක් දුරට එළිදරව් වේවි.

මේ අවස්ථාවේදී මට තවත් කාරණයක් මතක් වුණා. අපේ අග්‍රාමාත්‍යතුමා කොලොත්තාවේදී කියා තිබෙනවා, අපේ ආරක්ෂක බලකායන්ට ටයර් එකකටවත් වෙඩි තබන්නට හැකියාවක් තිබුණේ නැහැ කියා. [බාධා කිරීම්] කාට හෝ. අපට ආයුධ නැහැනෙ. සාමාන්‍ය ජනතාවගෙ අතේ ආයුධ නැහැ. වෙඩි තබන්න බැහැනෙ, ආයුධ නැතිව.

විරසිංහ මල්ලිමාරච්චි මහතා (කොළඹ දිස්ත්‍රික් ඇමතිතුමා)
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி — கொழும்பு மாவட்ட அமைச்சர்)
(Mr. Weerasinghe Mallimaratchi, District Minister, Colombo)

වෙඩි තියන්න කිව්වෙ නැහැ. ගලක් හෝ ගහන්න කියල කිව්වෙ. ටයර් එකක හුළං අරින්න කියල කිව්වෙ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සෙ කියන දේ මම පිළිගන්නවා. නමුත් ටයර් එකක හුළං අරින්නත් බැහැනෙ. ගමන් කරන වාහනයක් ළඟට ගිහින්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ටයර් එකේ හුළං යවපු අයත් ඉන්නවා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

අපි අහන්නෙ මෙයයි. මේ රටේ—[බාධා කිරීම්]

විරසිංහ මල්ලිමාරච්චි මහතා
(திரு. வீரசிங்ஹ மல்லிமாரச்சி)
(Mr. Weerasinghe Mallimaratchi)

තමුසෙගෙ හුළං නිකම්ම ගිහිල්ලා තියෙන්නේ. වාඩි වෙන්න.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ආරක්ෂක තත්ත්වයේ පිරිහී යාම කෙනෙක් දුරට සිද්ධ වෙලා තිබෙනවාද කියන එක තමයි, අගමැතිතුමාගේ කථාවෙන් පැහැදිලි කරන්නේ. අද රටේ ආරක්ෂක තත්ත්වයක් නැහැ. හදිසි අවස්ථාවකදී ඉදිරිපත් වෙලා ගලක්වත් විසි කරන්නට මහජනයා සූදානම් නැහැ. ඒක තමයි මේ ආරක්ෂක බලකායයන් භාර උදවිය—ආරක්ෂක තත්ත්වයන් භාර උදවිය—අවුරුදු එකාහමාරක් තිස්සෙ හදිසි නීතිය දීර්ඝ කර ගනිමින් කර තිබෙන දෙය. දැන් ඒ තත්ත්වයටයි, ඇවිත් තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලයේම අගමැතිවරයාගේ කථාවෙන් මේ රටේ ආරක්ෂක වැඩපිළිවෙළක් නැහැ කියන එක පැහැදිලිව පෙන්නුම් කරනවා. එසේ නම් තමුන්නාන්සේලා හදිසි නීතිය ඉල්ලන්නේ කුමක් සඳහාද ? මේ අවස්ථාවේදීත් කොළඹ විශ්ව විද්‍යාලය අවට පොලිස් බල ඇණියක් තිබෙනවා. අදත් තිබෙනවා. තරුණ ශිෂ්‍යයන් ඉදිරියේ පොලිස් බල ඇණිය ද ගෙන තුවක්කු දික් කරගෙන ඉන්නවා. ඔවුන් ත්‍රස්තවාදීන්ලු. ඇයි ? අධ්‍යාපන රටාව පිළිබඳ අදහස් පළ කරනවාය කියා ඔවුන් ත්‍රස්තවාදීන් ගණයට දා තුවක්කු දික් කරගෙන ඉන්නවා. එවැනි කටයුතු සඳහාද හදිසි නීතිය ඉල්ලන්නේ ?

පසුගිය දවස් හතර පහ ඇතුළතදී මේ රටේ වාමාංශික පක්ෂවලය කියන උදවිය අත් අඩංගුවට ගන්නට පටන් ගෙන තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අයය කියලා අත් අඩංගුවට ගන්නට පටන් ගෙන තිබෙනවා. කොළඹ සංවර්ධන සභාවේ සහිකයෙකුත් අත් අඩංගුවට ගෙන තිබෙනවා. ඔහු මේ රටේ හය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව දිවුරුම් දී තිබෙන කෙනෙක්. ඔහු මේ සංවර්ධන සභාවේ සෑම කටයුත්තකදීම සහභාගිවෙලා තිබෙන කෙනෙක්. තමුන්නාන්සේලා මේ විධියට අද අලුත් දෙයක් ඇති කරන්නට හදනවා. ඒ එකක්. අනෙක් අතට, ජනතා විමුක්ති පෙරමුණේ අයය කියා එම පක්ෂයට නැති අයත් අත් අඩංගුවට ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා කවුරු හෝ පෙත්සමක් ගැසූ පමණින් අත් අඩංගුවට ගන්නා මේ වගකීමක් නැති තත්ත්වය තවත්වන හැටියට. මෙයින් සිදුවන්නේ මහජනතා කුලප්පු කිරීම පමණයි.

එක්සත් ජාතික පක්ෂයට මහරගම ආසනයේ සල්ලි වියදම් කරගෙන වැඩ කළ කෙනෙක් අත් අඩංගුවේ ඉන්නවා, මහරගම. හිරගෙදර ඇතුළේ. එයා ජනතා විමුක්ති පෙරමුණේද ? නැහැ. එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක්.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

එහෙනම් නීතිය කාටත් පොදුයි.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

නීතිය පොදු නැහැ. තමුන්නාන්සේලා මේ එක එක්කෙනාගේ පෞද්ගලික වෛරයත් සහ දේශපාලන විරුද්ධවාදීකම් හාරා අවුස්සා මහජනයාට පෙන්නුම් කරන්න හදනවා, " මේ කුමන්ත්‍රණය පිටුපස ඉන්න අයගේ විශාල වශයෙන් සම්බන්ධකම් තිබෙන්නේ වාමාංශික පක්ෂ සමහය ; එම නිසා මේක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

වාමාංශික කුමන්ත්‍රණයක්ය, මාක්ස්වාදී කුමන්ත්‍රණයක්ය " කියා. බ්‍රිගේඩියර් විරතුංග මහතා පළමුවරට යාපනයට යන විට මේක මාක්ස්වාදී කුමන්ත්‍රණයක්ය කියලා තමුන්නාන්සේලා කිව්වාද ? නැහැ. වටමේස සාකච්ඡාව තිබෙන අවස්ථාවේදී මෙය මාක්ස්වාදී කුමන්ත්‍රණයක්ය කියා තමුන්නාන්සේලා කිව්වාද ? මාක්ස්වාදී පක්ෂ කිහිපයක් වටමේස සාකච්ඡාවේ හිටියා. එද එසේ කිව්වාද ? නැහැ. ආරක්ෂක තත්ත්වයත් පමණක් නොව රටේ ජාතික ස්වාධීනත්වයවත් රැක ගන්නට බැරි තත්ත්වයක් ආවාට පස්සේ තමුන්නාන්සේලා මෙය හිතාමතාම කරන දෙයක්. තමුන්නාන්සේලාගේ විදේශ ප්‍රතිපත්තිය අධිරාජ්‍යවාදී යුද බලවතුන්ගේ ඕනෑකමට වෙනස් කර මිත්‍ර රටවල් අමතාප කරගෙන රටේ තත්ත්වය අවුල් ජාලාවක් බවට පරිවර්තනය කර ගත්තාට පස්සේ මේක මාක්ස්වාදී කුමන්ත්‍රණයක්ය කියලා අප ජනතාවට ඒත්තු ගන්වන්නට හදනවා. [බාධා කිරීම] අනුරාධපුරයට ගැහුවේ ප්‍රභාකරන් කල්ලියට සම්බන්ධ අයය කියා ජාතික ආරක්ෂක අමාත්‍යවරයා කියනවා. ප්‍රභාකරන් කල්ලිය මාක්ස්වාදයට විරුද්ධ බව ප්‍රසිද්ධියේම ප්‍රකාශ කර තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ ප්‍රගතිශීලී සියලු කොටස්වලට මේ ආකාරයෙන් චෝදනා නගලා දේශපාලන වශයෙන් මේ රට රවටටන්නට හදනවා.

අද අත් අඩංගුවට ගෙන තිබෙන අය අතර, අතුරුගිරියේ පොලීසිය මගින් පෙරේද අත් අඩංගුවට ගෙන තිබෙනවා හත් මාසයක ගැබිණි මාතාවක්. ලැජ්ජා නැහැ. මනුස්ස කම්වල පුලුට්ටක් තිබෙනවා නම් ගැබිණි මාතාවක් අත්අඩංගුවට අරගෙන රාත්‍රී දෙකක් ගත කරන්නට නියම කරන්නේ නැහැ. මේ වාගේ උදහරණ ඕනෑ තරම් දෙන්න පුළුවන්. ඒ මාතාව ජනතා විමුක්ති පෙරමුණේ නොවෙයි. මේ විධියට සාමාන්‍ය ජනයා කුපිත කර තමුන්නාන්සේලා කරගෙන යන දෙයින් අරාජික තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අද හුඟක් පළාත්වලට දුම්රිය යන්නේ නැහැ. ලියුම් යන්නේ නැහැ. ලොරි යන්නේ නැහැ.

ලලිත් ඇතුලත් මුදලි මහතා
(திரு. லலித் அத்துலத்முதலி)
(Mr. Lalith Athulath Mudali)

මන්ත්‍රීතුමා, අතුරුගිරිය සිද්ධියට සම්බන්ධ නම් ආදී විස්තර අපිට දුන්නොත් සොයා බලන්න පුළුවන්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඇමතිතුමාට මම ඕනෑ වෙලාවක විස්තර දෙන්නම්. කඩුවෙල ගරු මන්ත්‍රීතුමා ගෙන් (ඒ. පී. පෝල් පෙරේරා මහතා) අහන්න. මෙය එතුමාගේ ආසනයට අයිතියි. එතුමා ඒ ගැන කියයි. එතුමා එයට සාක්ෂි දරයි. අද රටේ සම්බන්ධතාවයක් කඩා වැටිලා. අද සමහර ප්‍රදේශවලට දුම්රිය ගමන් කරන්නේ නැහැ. සමහර ප්‍රදේශවල තැපැල් සේවය නැහැ. එදිනෙද අවශ්‍යතාවයන් සපුරාලන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. රටේ තිබෙන්නේ අරාජික තත්ත්වයක්. බොහෝ ප්‍රදේශවල පරිපාලනය, කාර්යාල අඩපණ වෙලා තිබෙනවා. එම නිසා වගකීමකින් යුතුව මේ ප්‍රශ්නය තේරුම් —බේරුම් කර ගන්න තිබෙන අවස්ථාවක් ලෙස අපි මෙය සලකන්නට ඕනෑ. මේ අවස්ථාවේදී මේ රටේ දේශපාලන පක්ෂ එක් එක් පක්ෂවලට — තමන්ගේ විරුද්ධවාදී දේශපාලන පක්ෂවලට — චෝදනා කරලා හරියන්නේ නැහැ. ජනමත විචාරණය සියයට හතළිස් පහක් පමණ මේ රටේ ජනතාව තමුන්නාන්සේලාට විරුද්ධවයි, ඡන්දය දුන්නේ. ඒ අනුපාතයවත් මේ පාර්ලිමේන්තුවේ නියෝජිතය වෙනවාද ? නැහැ. තමුන්නාන්සේලාම අනුපාත ඡන්ද ක්‍රමය පිළිගත්තවා. තමුන්නාන්සේලා පාර්ලිමේන්තුවේ කාලය දික් කර ගත්තා. මේ තුළින් ඇති වූ කඩා වැටීමෙන් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදමය තක්සේරු කරන්නට බැහැ. විශාල පසු බෑමක්, රටේ ඇති වී තිබෙන්නේ. ජනාධිපතිතුමා කියනවා, " ජනාධිපතිත්වය, අගමැති, ඇමතිවරු, මන්ත්‍රීවරු, අධිකරණය ආදිය ආරක්ෂා කිරීමයි, ප්‍රජාතන්ත්‍රවාදයක ප්‍රධාන අංගය " කියලා. අධිකරණයේ නඩුකාරවරුන්ට විරුද්ධව කැරලි ගැසුවේ විපක්ෂයේ අපිද ? [බාධා කිරීම] කලු ඇල්බට්ලි ගැන මා කියන්නෙ නැහැ. අපි අහනවා, මෙයට විපක්ෂයද වගකියන්නට ඕනෑ කියා. උසාවියෙන් වැරදි කරුවන් බවට තීන්දු කළ අයට උසස්වීම් දුන්නේ විපක්ෂයේ අපිද ?

පොලීසියේ විනයක් නැහැ කියා කියනවා. පොලීසියේ විනයක් ඇති වෙයිද රටේ නීතියට වඩා ඉහළින් යන්න හදනවිට. හමුදාවට විනයක් ඇති වෙයිද නීතියට ඉහළින් යන්න හදන විට. ඒ තත්ත්වය ඇති කළේ තමුන්නාන්සේලාමයි. උසාවියෙන් දඬුවම් වින්ද අයෙක් යාපනයට මාරු කළ විට පොලීසියේ කටයුතු සඳහා, ඔහු කියනවා, " මම යන්නේ නැහැ ; මම රෝහලට ගිහින් වෛද්‍ය සහතිකයක් දෙනවා " කියල. යාපනයට යන්න තිබෙන අය තමුන්නාන්සේලා යවන්නේ තෝර තෝරායි. [බාධා කිරීම] Yes, you check on that. තමුන්නාන්සේ පොලීසියේ මාරුකරන අයගේ ලැයිස්තුව අරගෙන බලන්න, කීදෙනෙක් තමුන්නාන්සේලා මාරු කළාද ? කීදෙනෙක් ඒ මාරු කිරීම් වෙනස් කරගෙන නැවතිලා ඉන්නවාද කියා. මාරු කළ අය හා ගිය අය ගැන අපට ලෙඛණයක් දෙන්න

ලලිත් ඇතුලත් මුදලි මහතා
(திரு. லலித் அத்துலத்முதலி)
(Mr. Lalith Athulath Mudali)

නැහැ, නැහැ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

තමුන්නාන්සේලා ඕනෑ දේකට " නැහැ " කියන්න දක්ෂයි. තමුන්නාන්සේලා මේ තත්ත්වය ඕනෑකමින් ඇති කිරීමෙන් රටේ එදිනෙද තත්ත්වය අවුලෙන් අවුලට පරිවර්තනය වෙලා ඒ තුළින් තමුන්නාන්සේලා බලාපොරොත්තුවන දරුණු මර්ධනය පමණයි, ක්‍රියාත්මක කරන්නට ලැබෙන්නේ. ඒ නිසා අපි — [බාධා කිරීමක්]

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

Order, please !

Does the House agree to continue the Debate till 4.30 p.m. ?

මන්ත්‍රීවරු
(அங்கத்தினர்)
(Members)

Aye !

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආරක්ෂක තත්ත්වය පිරිහී යෑම ගැනයි මම කිව්වේ. රජය මෙයට සම්පූර්ණයෙන්ම වගකියන්න නෑ. ආරක්ෂක ඇමතිතුමා වගකියන්න ඕනෑ. ආරක්ෂක අංශ භාර අය වගකියන්න ඕනෑ. අනුරාධපුර සිද්ධියෙන් පසුව තවත් ස්ථාන ගණනක ඒ විධියේ විනාශ කිරීම් සිදු වුණා. පොළොන්නරුවේ මනම්පිටියේත්, පොලිස් භටයන් කීප දෙනෙකුත් ඒ වාගේම නැගෙනහිර පළාතේදී කොමාන්ඩෝ භටයන් කීප දෙනකුත් විනාශ කර තිබෙනවා. මේ අනුව තත්ත්වය වෙනස් වෙලා නැහැ. යාල අභය භූමියේ එහා කෙළවරේ මොකක්ද අද පවතින තත්ත්වය ? අද මෙය පැතිර යෑමක ස්වභාවයක් ඇති වී තිබෙනවා. තිකවැරටිය සිද්ධිය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා අත්අඩංගුවට ගත් අය කොහේද ඉන්නේ ? කොළඹ නගරයේ. තිකවැරටියට පහර දුන් අය කියා කොළඹ නගරය තුළින් කවුදෝ පිරිසක් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එහෙනම් මේ ගයාන්තක ත්‍රස්තවාදය ක්‍රියාත්මක කරන අය අද කොළඹ නගරය ඇතුළේ සිටිනවා. මොකක්ද තමුන්නාන්සේලා අරගෙන තිබෙන ආරක්ෂක පියවර ? ඒ ගැනයි, අපි අහන්නේ.

මහජනයා කෙරෙහි විශ්වාසයක් තබන්නට තමුන්නාන්සේලා ලැහැස්ති නැහැ. මේ රටේ සාමාන්‍ය එදිනෙද පරිපාලනය කෙරෙහි විශ්වාසයක් තබන්නට තමුන්නාන්සේලා ලැහැස්ති නැහැ. [බාධා කිරීමක්]. අද ඇති වී තිබෙන තත්ත්වය අනුව ආරක්ෂක තත්ත්වයක් හැටියට සාමාන්‍ය ජනතාවගේ ජීවිත ආරක්ෂා කරන්නට තමුන්නාන්සේලා අපොහොසත් වී සිටිනවා. තමුන්නාන්සේලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාමාර්ගයේ මූලධර්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්පූර්ණයෙන්ම කඩා දමා තිබෙනවා. ඒ නිසා අද නැඟිට චෝදනා කරන්නට එපා. යම් යම් කටයුතුවලදී මැදහත් වී කටයුතු කරන්නට පුළුවන් බව ඔබපමු අගමැතිතිය ප්‍රකාශ කළා යයි කියා එයට පිළිතුරු දීම නොවෙයි කරන්නට ඕනෑ. තමුන්නාන්සේලාට මේ ප්‍රශ්නය විසඳන්නට කාගේත් උදව් ඕනෑ නම්. බණ්ඩාරනායක මැතිතිය කියා තිබෙනවා, මේ ප්‍රශ්නය විසඳන්නට සහභාගී වන්නට එතුමියට පුළුවන්ය, නමුත් එතුමියට තිල බලයක් නැත කියා. එතුමියගේ ප්‍රජා අයිතිය වහාම දීම ජාතික යුතුකමක් හැටියට තමුන්නාන්සේලා දන්වත් සලකන්න. පහර දීම නෙවෙයි, කරන්නට ඕනෑ. එතුමියට ප්‍රශ්නය විසඳන්නට බැරිද කියා බලන්නට පුළුවන් වන්නේ ප්‍රජා අයිතිය දීලා ඉන්දීය ආණ්ඩුවත් සමඟ සාකච්ඡා කර පුළුවන් නම් ආරක්ෂක තත්ත්වය හදන්නය කියා එතුමිය පිටත් කර යැවීමෙනුයි. ඒකයි ආණ්ඩුවේ යුතුකම වන්නට ඕනෑ. එසේ නැතිව හැරී පහර දීම නොවෙයි.

විරුද්ධ පර්ශ්වයේ උදව් ඉල්ලනවා. තමුන්නාන්සේලා විරුද්ධ පාර්ශ්වයේ උදව් ඉල්ලන්නේ බොරුවටයි. තමුන්නාන්සේලාගේ හිත ඇතුළේ තමුන්නාන්සේලා සැලසුම් කර ගෙන තිබෙනවා තිබෙන තත්ත්වය. ආණ්ඩුව හැටියට මේ ප්‍රශ්නයට විසඳුමක් ඇති කර ගැනීම සඳහා—මේ ත්‍රස්තවාදී ප්‍රශ්නය විසඳීම සඳහා—ආරක්ෂක බලකායන් මඟින් කරන්නට තිබෙන වැඩ කටයුතු එක අංශයක්. මේ ප්‍රශ්නය තවත් ආකාරයකින් විසඳා ගැනීමේ ක්‍රියාදමය තවත් එකක්. ඒ ක්‍රියාදමය විසඳා ගැනීම සඳහා ඉන්දියාවේදී එක පොරොන්දුවක්, 1977 තවත් පෙරොන්දුවක්, අමිර්තලිංගම් මහත්මයාට තවත් පොරොන්දුවක්, තමුන්නාන්සේලා වටමේසයේදී තවත් පොරොන්දුවක් ආදී වශයෙන් පොරොන්දු ගණනාවක් නැතිව ආණ්ඩුව හැටියට එකක් කියන්න. තමුන්නාන්සේලාගේ පැහැදිලි ස්ථාවරය මත මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා අවශ්‍ය සාකච්ඡා මාර්ගවලට හවුල් වන්නට විරුද්ධ පාර්ශ්වයේ අපි සූදානම්. තමුන් රජයක් හැටියට කියන්න මෙන්න මේ තත්ත්වය අනුව මේ මේ සීමාවන් තුළ මේ ප්‍රශ්නය විසඳන්නට අපේ රජයේ තීරණයක් තිබෙනවාය කියා. පළමුව රජය අන්න ඒ තීරණය ගැනීමයි අද තිබෙන යුතුකම. ඉන් පසුවයි, මේ සාකච්ඡා මාර්ග සාර්ථක වන්නට පුළුවන් වාතාවරණයක් අරගන්නට පුළුවන් වන්නේ. තමන් තීරණයක් ගන්නේ නැතිව සාකච්ඡාවත් ඔතැම අතකට තල්ලු වෙවී යන්නට ඉඩ දී විෂක්ෂයේ අදහස් සොය සොයා ප්‍රශ්නය කල් දමන්නට රජය හිතනවා නම් විසඳුමක් එන්නේ නැහැ.

ආරක්ෂක අංශ අතින් තමුන්නාන්සේලා අසාර්ථක වී තිබෙනවා. දේශපාලනික අංශය අතින් අසාර්ථක වී තිබෙනවා. එමෙන්ම ජාතික නායකත්වය දිය හැකි මහා සංඝරත්නය මේ ප්‍රශ්නය විසඳීමට හැකි මාවත පිළිබඳව ඔවුන්ගේ අදහස් කියා තිබෙද්දී මේ පිළිබඳව රජයේ ස්ථාවරය පැහැදිලිව කියනවා පානවා නම් තමයි, මේ සම්බන්ධයෙන් දේශපාලන විසඳුමකට මාර්ගය තිබෙන්නේ. එසේ නැතිව තමුන්නාන්සේලා හිතේ එකක් තබාගෙන දේශපාලන සාකච්ඡා කොපමණ කළත් ප්‍රශ්නයට විසඳුමක් ලැබෙන්නේ නැහැ.

ආරක්ෂක බලකායන් තුළ අද තමුන්නාන්සේලා ඇති කර තිබෙන තත්ත්වය මම අවසාන වශයෙන් කියනවා. අනුරාධපුර්දී ලෙවුලේ නමැති කෝප්රල්වරයා වෙඩි තබා මැරුවා, ඔහු කඳවුර තුළදී දුවිඩ ජනතාව කීප දෙනෙකු මරුමුවට පත් කළාය කියා. ඒ සිද්ධිය ගැන අපි කණගාටු වෙනවා. නමුත් අවි බිම තැබුවාට පසුව යුධ හටයෙක් මරා දමන්නට හමුදාවේ නිලධාරියෙකුට බලයක් තිබෙනවාද ? මම අහන්නේ, අන්න ඒකයි. ඒ නිලධාරියා විසින් එම යුධ හටයා ඝාතනය කළේ ඔහු අවි බිම තැබුවාට පසුවයි. " රජරට රයිෆල් " හිස මුඩු කර තමුන්නාන්සේලා විසින් දියකර හරින්නට යෙදුණා. සිංහ රෙජමේන්තුව වෙනත් දේශපාලන පක්ෂයකට හිතවත් අයගෙන් සමන්විතය කියා විසුරුවා හැරියා.

තමුන්නාන්සේලා හමුදාව අවුල් ජාලාවක් බවට පරිවර්තනය කළ එකේ ප්‍රතිඵලය තමයි අද හමුදාවේ සමහර අංශ ඉක්මණින් ක්‍රියාත්මකවීමට දක්වන මැළිකම. මම තමුන්නාන්සේලාට කියනවා, විනය නැති කළේ තමුන්නාන්සේලායි. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා කිව්වා, ඊයේ තුවිවවේලිවල ඇති වූ තත්ත්වයේදී පොලීසිය සමග ඒකාබද්ධව ක්‍රියාදාමයකට යාමට හමුදාව මැළිකමක් දක්වා තිබෙන බව. ඒ ඇයි කියා අපි අහනවා, තමුන්නාන්සේලාගෙන්. මේවා වසං කරලා වැඩක් නැහැ. අපි දන්නේ නැහැ හොට අතිද්දට තමුන්නාන්සේලා ගන්න තීරණය. මුලු විපක්ෂයම තහනම් කරලා අප කවුරුත් අත් අඩංගුවට ගන්න පුළුවන්. ඒක නම් තමුන්නාන්සේලා හිතන විසඳුම අපි කියන්නට ඕනෑ මේ රටේ මහජනතාවගේ අයිතිවාසිකම් වළලා දමා තමුන්නාන්සේලා යන්නට හදන මාර්ගය මේ රටේ ජාතික ස්වාධීන්ත්වය, මේ රටේ ජාතික නිදහස, ඒකීයභාවය වළලා දමන එකක්ය කියා. එවැනි ගමනක තමයි තමුන්නාන්සේලා යෙදෙන්නට හදන්නේ. ඒ ප්‍රශ්නය විසඳීමේ පියවරවල් වශයෙන් ආණ්ඩුව හැටියට තමුන්නාන්සේලාට යන්නට පුළුවන් සීමාව කොතැනදීද කියන එක දැනගෙන තමුන්නාන්සේලා කටයුතු කළ යුතුයි.

අපේ අසල්වැසි රටවල් සමග විශේෂයෙන් ඉන්දියාව සමග අපේ මිත්‍රත්ත්වය තහවුරු කරගත යුතුයි. අපේ නිදහස රැක ගන්නා ගමන් සාකච්ඡා මාර්ග තුළින් විසඳුමක් ඇති කර ගැනීම සඳහා ඉන්දියාවේ සහයෝගය ලබාගැනීමට හැකි වාතාවරණයක් ඇති කළ යුතුයි. විපක්ෂයේ සෑම ජන කොටස්වලින්ම පළිගැනීම තවතා, ඒ අයගේ අයිතිවාසිකම් නැවත ලබා දී, ඒ තුළින් අළුත් වාතාවරණයක්, විශ්වාසයක් ඇති කළ යුතුව තිබෙනවා. මේ කණගාටුදායක ජාතික අර්බුදයේදී එවැනි තීරණයකට අවතීරණය වන ලෙස මම ඉතා ඔතැකමින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. එවැනි තත්ත්වයක් යටතේ පමණයි තමුන්නාන්සේලා සම්මත කරගන්නා හදිසි තීතියෙන් වැඩක් වෙන්නේ. තමුන් ඒක තමුන්නාන්සේලා අද ඔප්පුකර තැහැ. හදිසි තීතිය දක්කර ගැනීම පමණයි කරන්නේ. ඒ දික්කර ගැනීමෙන් මහජනතාවට හානිකර තත්ත්වයක් පමණයි තමුන්නාන්සේලා අදවතතුරු උදාකර තිබෙන්නේ. මේ හදිසි තීතිය සම්පූර්ණයෙන්ම මහජන ආරක්ෂාව සඳහා තමුන්නාන්සේලා පාවිච්චි කර කියන කියන එක කරුණු සහිතව අද ඔප්පුවෙලා තිබෙන නිසා ආණ්ඩුව මේ තත්ත්වය වෙනස් කළ යුතුයි. ඒ සඳහා විපක්ෂයේ කොටස් සමග සාකච්ඡාකර, විපක්ෂය ඉදිරිපත් කරන අදහස්වලට එකඟවෙලා, යම් යම් කරුණුවලදී ආණ්ඩුව පසුබසින්නට ඕනෑ නම් ඒ පසුබැසීම ජාතියේ ආරක්ෂාව සඳහා ඉෂ්ට කරන ක්‍රියාවක් ලෙස සලකන ලෙස තැවතත් ඉල්ලමින් මම තවතිනවා.

අ. භා. 3. 40

පර්සි සමරවීර මහතා (නියෝජ්‍ය ස්වදේශ කටයුතු ඇමතිතුමා)
(திரு. பேஸி சமரவீர — உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(Mr. Percy Samaraweera–Deputy Minister of Home Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමනි, මම සන්තෝෂ වෙනවා මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) කථාවෙන් පසුව මේ විවාදයේදී වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවකාශයක් ලැබීම ගැන. ජාතියත්, රටත් ඉතාමත්ම භයානක අවස්ථාවකට මුහුණ දී සිටින මේ මොහොතේ මහරගම ගරු මන්ත්‍රීතුමා සිය කතාව පටන්ගත් ආකාරයෙන්ම අවසාන කිරීම ගැන එක් අතකින් මම කණගාටු වෙනවා. එතුමාත්, විරුද්ධ පක්ෂයත්, බාගවිට කල්පනා කරනවා ඇති ඉන්දියාවත් සමග අපේ තිබෙන මිත්‍රත්ත්වය පළුදු වූවා නම්, එය තැවත හරිගස්සා දෙන්න දූත මෙහෙය කරන්න බණ්ඩාරනායක මැතිණියට වඩා සුදුස්සෙක් මේ රටේ නැත කියා. එහෙම වෙන්න ඇති කල්පනා කරන්නෙ ? මම තමුන්නාන්සේලාට මතක් කරන්න ඕනෑ ගාන්ධි මැතිණිය සිටි කාලයේ බණ්ඩාරනායක මැතිණිය යම් හාදකමක්, සම්බන්ධකමක් ඉන්දීය රජය සමග ඇති කරගෙන තිබුණා නම්, එහි ප්‍රතිඵලය. මේ ගරු සභාවේදී මම අවධාරණයෙන්ම එය මතක් කරනවා ; මහවැලි ගඟේ වතුර ටික උතුරට ගෙනයන්න හැදුවොත් ඉන්දිරා ගාන්ධි මැතිණියගේ සුහද සාකච්ඡාවකින් පසුවය කියන එක, මම කියනවා. අවාසනාවකට, එවකට වාරිමාර්ග ඇමතිතුමා හැටියට කටයුතු කළ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මහතා) මේ අවස්ථාවේ මෙතැන නැහැ. එතුමා සිටියා නම් අපට අසන්නට තිබුණා මහවැලි ගඟේ වතුර වච්චියාව හරහා උතුරට ගෙන යන්නට සූදානම් වුණේ මොන හේතුවක් නිසාද කියා. තමුන්නාන්සේට මෙකට උත්තරයක් දෙන්න බැහැ. තමුන්නාන්සේ ඒක දන්නෙ නැහැ, හේතුව මොකක්ද ? ඉන්දිරා ගාන්ධි මැතිණියත් සමග සිරිමා බණ්ඩාරනායක මැතිණිය ඇති කරගත් සුහද සාකච්ඡාවක් තිසයි.

එම්. හලීම් ඉෂාක් මහතා (මැද කොළඹ තුන්වන)
(ஜனாப் எம். ஹலீம் இஸாக் — கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர்)
(Mr. M. Haleem Ishak–Third Colombo Central)

උතුර, ලංකාව නොවෙයිද ?

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

උතුර ලංකාව තමයි. එහෙම වුණා නම් ඇති වන විපාකය මම කියන්නම්. ඇත්තවශයෙන්ම ඉන්දිරා ගාන්ධි මැතිණියට වුවමනා කර තිබුණේ වතුර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මහතා]

ටික එහාට ගන්නට පමණක් නොවෙයි. බැරි වෙලාවත් ඒ සැලැස්ම අද ක්‍රියාත්මක වී තිබුණාතම් උතුරේ මායිම වෙන්නේ අනුරාධපුරය බව තමුන්නාන්සේලා පිළිගන්නට ඕනෑ.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)
ඒ කොහොමද ?

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
ඒ කොහොමද කියලා අහනවා. එහෙනම් තමුන්නාන්සේලාට සුදුසු සැලැස්මක් හදගන්නට පුළුවනි, අවශ්‍ය විධියට. ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලාගේ මැතිණිය පාකිස්ථාන් ගුවන් යානාවලට ඉන්ධන පිරවීම සඳහා තවත්වත්නට අවසරය දුන් වේලාවේදී, ඉන්දියානු ආණ්ඩුව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ක්‍රියා පිළිබඳව යම්කිසි කුතුහලයකට පත් වුණු වේලාවේදී මොකද කළේ ? මැතිණිය ඇමෙරිකාවට දිව්වා, නික්සන් හම්බු වෙන්නට. එහෙම ගිහිත් ඇවිත් මොකද කළේ ? කළ දේ මොකක්ද කියා සාක්ෂි හැටියට එද එතුමිය ඉදිරිපත් කළ කැබිනට් සන්දේශය මා ළඟ තිබෙනවා. ඒ කැබිනට් සන්දේශයේ සඳහන් වී තිබුණා, ඉන්දිරා ගාන්ධි මැතිණියට විරුද්ධව නික්සන් ජනාධිපති කළ ප්‍රකාශය, වචනයෙන් වචනයට පුළුවන්ද මේවාට උත්තර දෙන්නට. තමුන්නාන්සේලාගේ හිතේ දැන් තිබෙනවා, මේ දූත ගමන යන්නටත් එතුමිය හැර වෙනත් කෙනෙක් මේ රටේ නැත කියා. ඒක නොවෙයි අප බලාපොරොත්තු වෙන්නේ. අප බලාපොරොත්තු වෙන්නේ අද මේ ජාතිය වැටී තිබෙන මෙම අවදනම් තත්ත්වයෙන් මුදවා ගන්නට ඒ අයගේ සහාය පැතීමයි. ඒ අය යම් ආකාරයකින් කියනවා නම්, මැතිණියට පුරවැසිකම් දෙන්නට ඕනෑ, අපි මේ විධියට වැඩ කරන්නට ඕනෑ, ඒ කොන්දේසි මත කටයුතු කරන්නට සූදානම් වෙනවා නම් පමණයි සහාය දෙන්නේ කියා, එසේ නම් ඒ අත්දමට සහාය ලබා ගන්නෙත් නැහැ, ඒ අත්දමට සහායක් ලබා ගන්නට අපි බලාපොරොත්තු වෙන්නේත් නැති බව කියන්නට ඕනෑ.

අද පවතින ත්‍රස්තවාදය ගැන කල්පනා කරන විට යුද්ධයක් ප්‍රකාශ කර ඇති බවක් පෙනෙනවා. ඒ තත්ත්වයට මුහුණ දෙන්නට නම් අපේ රටේ සෑම සිංහලයකුම එක්කාසු වෙන්නට ඕනෑ. එසේ එක්කාසු නොවී සටන් කරන්නට බැහැ. මහරගම මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) කියන්නට හැදුවේ මොකක්ද ? ඇත්තවශයෙන්ම අපේ පොලිසියත් හමුදාවත් මෙවැනි යුද්ධයක් කරන්නට සූදානම් වී සිටියේ නැහැ. අපේ පොලිසිය කවදාවත් සූදානම් වී සිටියේ නැහැ, මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්නට. නමුත් අවාසනාවකට වාගේ මෙබඳු තත්ත්වයක් මේ රටේ පැන නැගුණා. සමහර විට එතුමන්ලා දන්නේ නැතිව ඇති, ත්‍රස්තවාදී වැඩ පිළිවෙළ මේ රටේ ආරම්භ වුණේ, බුද්ධ ශාසනය වැනසීම ආරම්භ වුණේ බණ්ඩාරනායක උන්නැහේගේ ඝාතනයෙන් පසුව බව. මම ඒ බව තමුන්නාන්සේලාට ඔප්පු කරන්නම්.

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
හා !

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
මොකද හා ! කියන්නේ. තමුන්නාන්සේ එතකොට කොහේද ඉස්කෝලයක උගන්වනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
තමුන්නාන්සේ 1965 දී මැතිණිය ගාවට ගිහින් වැදලා සහයෝගය ඉල්ලුවා. රාජරත්නව පැරැද්දුවේ මැතිණිය ගාවට ගිහින් සහයෝගය ඉල්ලලයි. තමුන්නාන්සේට දැන් ඒව මතක නැහැ. [බාධා කිරීමක්]

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
මොනවාද මේ කියන්නේ, තමුන්නාන්සේට මම අවස්ථාව දෙනවා කියන දෙයක් තැගිටල කියන්න.

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, මම කියනවා, දැන් ඉන්න මේ තියෝජ්‍ය ඇමතිතුමා, 1965 දී වැලිමඩ මැතිවරණයේදී රාජරත්න මහත්මයාට විරුද්ධව මැතිණියගේ සහයෝගය ඉල්ලුවාය කියලා.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
කවුද ඉල්ලුවේ ?

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
තමුන්නාන්සේ.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
එද රාජරත්නට විරුද්ධව මට සහයෝගය දුන්නේ රාජරත්නත් එක්ක තිබුණු තරහ නිසයි. තමුන්නාන්සේ ඒක දන්නවාද ?

රිචඩ් පතිරණ මහතා
(திரு. ரிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
මම දන්නවා තත්ත්වය.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
දන්නෙ නැති ඒවාට කථා කරන්නේ නැතිව කට වහ ගන්නවා. [බාධා කිරීමක්]

වීරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. வீரவன்னி சமரவீர — கல்விப் பிரதி அமைச்சர்)
(Mr. Weerawanni Samaraweera Deputy Minister of Education)
මිනිහා ඒ දවස්වල වැවර කපනවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
Order, please ! Will the hon. Members please co-operate with me because otherwise it is very difficult for me ? Yes, the Hon. Member can continue.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහරගම මන්ත්‍රීතුමා මේ ගරු සභාවට ඒත්තු ගන්වන්නට හැදුවේ උතුරේ ත්‍රස්තවාදීන් අද කරගෙන යන සටනට මේ රටේ අන්ත වාමාංශික දේශපාලන පක්ෂවල සහයෝගය නැති බවයි. මා ඔප්පු කරනවා එය එසේ නොවන බව. මේ රටේ අන්ත වාමාංශික දේශපාලන පක්ෂයක් හැටියට අප පිළිගන්නවා, ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණේ උදවිය සම්බන්ධ වුන එක සිද්ධියක් මම කියන්නම්. මේ ඒයෙ පෙරේද දවසක සියයට සියයක් සිංහල පිරිස ජීවත් වන වත්තේගම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුම්බර ප්‍රදේශයේ ගෙයක් වටලා පොලීසිය විසින් බෝම්බ වගයක් අත් අඩංගුවට ගත් බව තමුන්නාන්සේට මතක ඇති. බෝම්බ එකොළහක් හද තිබුණා. ඒවා ප්ලාස්ටික් කැන්වල හැදූ බෝම්බ. ත්‍රස්තවාදීන් පාවිච්චි කරන ' ලැන්ඩ් මයින් ' කියන බෝම්බ වර්ගය හදන්නෙත් ඒ ආකාරයටමයි. බෝම්බ පමණක් නෙවෙයි, හමු වුනේ. මේ ගෙදර තිබි ඉන්දියාවේ සාදන ලද ගිනි පෙට්ටිත් හමු වී තිබෙනවා. ' ෂොට් ගන් ' තුවක්කුවලට දමන ඉන්දියාවේ සාදන ලද පතරොම් දෙකකුත් තිබුණා. ඒවා සියල්ලක්ම අද මහතුවර පොලිස් අත් අඩංගුවේ තිබෙනවා. කවුද මේකට සම්බන්ධ වුනේ ? 1971 කැරැල්ලට සම්බන්ධ වී අවුරුදු දෙක හමාර බැගින් හිරේ ගිය පුද්ගලයන් දෙදෙනෙකුයි ඒ කණ්ඩායමේ නායකයන් දෙදෙනා. ඉතින් තමුන්නාන්සේ ජනතා විමුක්ති පෙරමුණ මේකට සම්බන්ධ නැහැයි කියා කොහොමද කියන්නේ ? උතුරේ උදවිය පමණක් නොවෙයි, දකුණේ සිංහල උදවියත් මේකට පක්ෂයි කියා උමා මහේශ්වරන් ඉන්දියාවේ සිට ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් කියනවා.

දිනේෂ ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් නෙවෙයි, තොන්ඩමන් ඇමතිතුමායි උමා මහේශ්වරන් හමු වුණේ.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

දකුණේ සිංහල මිතියුන් මේකට පක්ෂයි කියා අත්ත පෙරේද පත්තරේ කියා තිබෙනවා.

දිනේෂ ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

දකුණේ සිංහල මිතියුන් නොවෙයි, තොන්ඩමන් ඇමතිතුමා හමු වුන එක ගැන තමුන්නාන්සේලා මොකද කියන්නේ ? සිංහලයන් පදිංචි කරවන්න එපා යයි කියන්නේ තොන්ඩමන් ඇමතිතුමායි. කැරලි ගහන්නට කියනවා. සිංහලයන් එවනවාට විරුද්ධව කැරලි ගහන්නට කියනවා. කැරලි නායකයා එයායි.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)

තොන්ඩමන් ඇමතිතුමා නොවෙයි, මොන ඇමතිතුමා කිව්වත් අපි උතුරේ සිංහල ජනතාව පදිංචි කරවන එක පදිංචි කරවනවාමයි. තමුන්නාන්සේලා ඒවාට උදව් වෙන්න එන්නේ නැත්තම් නිකම් ඉන්න.

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නට හැදුවේ ඒක නොවෙයි. ජනතා විමුක්ති පෙරමුණේ උදවිය මෙයට සම්බන්ධ වී අපේ ආගමත්, භාෂාවත්, සංස්කෘතියත් නැති කරන්නට සූදනම් වී සිටින්නේ මොන විධියටද කියන එකයි මම කියාගෙන ආවේ. ජනතා විමුක්ති පෙරමුණේ පාඩම් පහ ඉගෙන ගන්නට මෙතුමා ගිහින් නැතිව ඇති.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තමුන්නාන්සේ ගිහිත් නැහැ. ඒ පාඩම් පහෙන් කියා දෙන්නේ මොනවාදැයි ගිය කෙනෙක් ගෙන්නලා අහන්න. තමන්ගේ අප්පා හඳුනා ගන්නට බැරි එක, තමන්ගේ මව හඳුනා ගන්නට බැරි එක, තමන්ගේ සහෝදර සහෝදරියන් හඳුනා ගන්නට බැරි එක. ඒ ත්‍රස්තවාදියෙකුට, ජනතා විමුක්ති පෙරමුණේ උදවියට කියා දෙන පාඩම්න් එක කොටසක් නම්, ඒ අයගේ ආකල්ප සම්පූර්ණයෙන්ම විකල්ප කර දමනවා නම්, එහෙම නම් මේ අය මේ සිදු වන සිද්ධිවලට කොයි තරම් දුරට සම්බන්ධද කියන එක අපට පෙනෙනවා.

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, මෙහි පසුපස තිබෙන්නේ අපි කවුරුත් කථා කරන සිංහල ජනතාව කුපිත කිරීම පමණක් නොවෙයි. සිංහල ජනතාව කුපිත කරන්නට නම් ඔය විධියට වැඩ කටයුතු කරන්නට ඕනෑ නැහැ. මේකේ පසුපස තිබෙන්නේ වෙනත් දෙයක්. මම බණ්ඩාරනායක ඝාතනය ගැන මතක් කළා. මම මේවා මේ ගරු සභාවේදී මීට කලිනුත් මතක් කර තිබෙනවා. බණ්ඩාරනායක ඝාතනය කිරීමට කැළණියේ රජ මහා විහාරාධිපති බුද්ධරක්ඛිත ස්වාමීන් වහන්සේට සිවුරක් පෙරවූ මිනිහෙක් අවශ්‍ය වුණේ නැහැ. එහෙත්ම ඇයි ඒකට සිවුරක් පෙරවූ මිනිහෙක් යෙදෙව්වේ ? ඒ සියල්ලේම යම්කිසි පසුබිමක් තිබෙනවා. එහෙම නම් ඒවාගේම තමයි මේකත්. අවුරුදු පහළොවකට, විස්සකට පස්සේ අනුරාධපුරයට ත්‍රස්තවාදීන් ගහන විට ඇයි ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟට ගියේ ? ලංකාව මේවාගේ ආක්‍රමණ කීපයකට මුහුණ දී තිබෙනවා. ඉන්දියාවේ සිට චෝලයන් ඇවිදින් ලංකාව ආක්‍රමණය කළා. ඒ ආක්‍රමණය කළ පිළිවෙළ මහාවංශයේ සඳහන් වෙනවා. ඒ අය පන්සල් කැඩුවා, වෙහෙර විහාර කැඩුවා. ශ්‍රී මහා බෝධීන් වහන්සේට පමණක් අත තිබ්බේ නැහැ. ඊට අමතරව මේ රටට පෘතුගීසි කාරයන් ආවා. ඕලන්දකාරයන් ආවා. ඉංග්‍රීසිකාරයන් ආවා. මේ රට යටත් කර ගත්තා. ඒ කොයි කවුරුත් ශ්‍රී මහා බෝධීන් වහන්සේට අත තිබ්බේ නැහැ. ඔය විධියේ වැඩක් කවුරුවත් කළේ නැහැ. එහෙම නම් කොටි රැළකට පමණද මෙය කරන්න වුවමනා වුණේ ? මෙය තමයි ඒ අයගේ හිතේ තිබෙන අර ආකල්පය. රටේ ජනතාව තුළ, බෞද්ධ රටේ බෞද්ධ ජනතාව තුළ යම්කිසි විශ්වාසයක් තිබෙනවා නම්, යම්කිසි පිළිපැදීමක් තිබෙනවා නම් ඒ සියල්ලටම මේ විධියට ද්‍රෝහිකම් කර ඒ තිබෙන හැඟීම්වලින් ඔවුන් ඇත් කිරීමයි ඔවුන්ගේ ප්‍රයත්නය වන්නෙ. ඊළඟ ප්‍රහාරය කතරගමට එල්ල වුණොත් මම පුදුම වෙන්නෙ නැහැ. ඒ අයගේ න්‍යායය එයයි.

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, අපි අද මේ තත්ත්වයට මුහුණු දෙනවා. අපි කථා කරන විධියට, මහජනතාව අද කල්පනා කරන විධියට ඉතාම භයානක තත්ත්වයකට අපි මුහුණපා සිටින බව මේ සභාවේ ඉන්න සියලු දෙනාම පිළිගන්නවා ඇති. අද මේ රජයට කරන්නට සිදුවී තිබෙන්නෙ ඊලමට විරුද්ධව සටන් කිරීම පමණක් නොවෙයි. ජාතිය බේරා ගැනීමේ සටනකට, ආගම බේරා ගැනීමේ සටනකට, මුළු රටම බේරා ගැනීමේ සටනකට මුහුණ දී තිබෙන බව මුළු මහත් ලෝකයටම පෙන්වන්න සිදු වී තිබෙනවා. අන්න ඒ නිසා තමයි මේ ආයාවතය කළේ. තමුන් තමුන්නාන්සේලා මේ විධියට අදහස් ප්‍රකාශ කිරීම, රජයේ වැරදි නිසාම මේ විධියේ අඩුපාඩුකම් සිදුවෙනවා යයි කීම, ඒ සියලුම වැරදි අපිටම එල්ල කිරීම ඉතාම වැරදියි. මම කලින් මතක් කළ විධියට කොයි තරම් දුරට, කොයි තරම් ආත්ම පරිත්‍යාගයෙන් යුතුව මේ රටේ යුද හමුදාවත්, පොලිස් හමුදාවත් පසුගිය කාලවලදී කටයුතු කළාද කියා අපි දන්නවා. ඒ ඒ අවස්ථාවලදී ඒ අය සම්බන්ධයෙන් කණගාටුව පළ කරන්නට හෝ ඒ අයට ස්තුති කරන්නට හෝ කවිද ඉදිරිපත් වුණේ ? ඒ නිසා මා මතක් කරන්න ඕනෑ, හමුදාවේ අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. අනුරාධපුර සිද්ධියත් සමහර විට ඒ අයගේ අඩුපාඩුකම් නිසා ඒ තත්ත්වයෙන් සිදුවෙන්න ඇති. තමුන් එවැනි සිද්ධියකදී ඒ අයට ඒ රාජකාරිය කරන්නය කියා ආණ්ඩුවෙන් නියෝග කිරීමක් තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම් එය වැරදියි. තමුන්නාන්සේලා එය පිළිගන්නෙ නැද්ද ? යම්කිසි රාජකාරියක් කිරීම පිණිස හමුදාවක් පොලීසියක් ඉන්නවා නම්, ජාතියේ රැකවරණය සඳහා ඒ ඒ අවස්ථානුකූලව, කාලානුරූපව ඒ අය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත් යම්කිසි හේතුවක් නිසා මේ විධියට වුණා වෙන්න ඇති.

[බාධා කිරීමක්]

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, 1958 දී මොකද වුණේ ? 1958 දී මේ වගේ සිද්ධිත් කොයි තරම් මේ රටේ ඇති වුණාද ? 1958 සටන වගේ නොවෙයි මේ සටන. අපි ඊද තාර ගැවා පමණයි. තමුන් අපි අද ලෝකයේම තිබෙන උසස්ම මට්ටමින් තීක්ෂ්‍ණතය කරන ලද අවිආයුධවලට මුහුණ දෙන්න ඕනෑ. කෙල්ලා. කොල්ලො 8,000 ක් පමණ මරමින් මර්ධනය කළ, 1971 දී පටන් ගත්ත ඒ වැඩ පිළිවෙල මෙයට සමාන කරන්න තමුන්නාන්සේලා උත්සාහ කරනවා. එද ඒ අයට තිබුණෙ පෙට්‍රල් බෝම්බ පමණයි. පතුරමක් දමා වෙඩි තියන්න පුළුවන් කබල් තුවක්කු පමණයි. අද තත්ත්වය කොහොමද ? තමුන්නාන්සේලාත් අපිත් දක තැති අවිආයුධ, නවීන පන්නයේ අවිආයුධ ත්‍රස්තවාදීන් පාවිච්චි කරනවා. ඒ නිසාම තමයි අපි සොයා ගන්න ඕනෑ, මේවා කොහෙන්ද ගෙනෙන්නෙ කියා. කොහෙන්ද මේවා ලැබෙන්නේ ? කවිද මේවාට මුදල් දෙන්නෙ ? මේ ආධාර ලැබෙන්නෙ කාගෙන්ද ? ඒ ගැන සොයා ගෙන යන විට තමයි යම් යම් අවාසනාවන්ත විධියේ ආරංචි අපට ලැබෙන්නෙ. මේවා ලැබෙන්නෙ මෙහෙමයි, මේවා ඉගෙණ ගන්නෙ අසුවල් ස්ථානයේදීයි. පාඩම් ඉගෙණ ගන්නෙ අසුවල් ස්ථානයේදීයි කියා අපට ආරංචි ලැබෙනවා. ඔන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මහතා]

ඔය සියලුම දේට මුහුණ දෙමින් රජය කටයුතු කරන්න ඕනෑ. ඔය සියලු දේම ඔය විධියට පවතිද්දී මේ රජය මේ ආකාරයයි, ජනාධිපතිතුමා මේ ආකාරයයි කියා මුළු රටටම හඬනගා කියන්නට අද මේ අය සූදානම් වෙනවා.

රිචඩ් පතිරණ මහතා
(திரு. றிச்சட் பத்திரன)
(Mr. Richard Pathirana)
රට දන්නවා, අපි කියන්න ඕනෑ නැහැ.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ අයට මතක් කර දෙන්න ඕනෑ. [බාධා කිරීම්]

තියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
Order, please ! Only one hon. Member can speak at a time. You must not disturb the hon. Member who is speaking. You must allow him to speak. Hon Member you have four more minutes.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
I want another five minutes.

තියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)
You can have one more minute.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
මම කියන්න හැදුවේ මෙයයි. 1977 දී මේ ආණ්ඩුවට බලයට පත් වුණාට පසු මේ රටේ නැවත කිසි කලක වෙතස් කරන්නට බැරි විධියේ නීති රීති පනවා, නීති රීති පාර්ලිමේන්තුවේ සම්මත කොට මේ රටේ බහුතර ජනතාව වන සිංහල ජනාවගේ අයිතිවාසිකම් රැක්කාද නැද්ද කියන ප්‍රශ්නයට තමුන්නාන්සේලා පුළුවන් නම් උත්තර දෙන්න [බාධාකිරීමක්] 1977 මහා මැතිවරණයේදී වාගේ මැතිවරණ ප්‍රතිඵල ලැබුණු අවස්ථා කීපයක් පසුගිය කාලයේදී මේ රටේ තිබුණා. මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) ආදරණීය පියාණන් සම්බන්ධව සිටි මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව මේ රටේ බලයට පත් වන විට එක්සත් ජාතික පක්ෂය මේ පාර්ලිමේන්තුවේ ආසන අටට බැස්සා. ඒ විධියේ මැතිවරණ ප්‍රතිඵල තිබුණා. නමුත් ඒ මැතිවරණ ප්‍රතිඵල සම්බන්ධයෙන් තිබුණු තත්ත්වය මිට ඉස්සර පෙනුණේ මොන නායකයාටද ? මේ රටේ මහජනතාව ඡන්දය පාවිච්චි කරන අවස්ථාවක තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දෙනවා. නමුත් ඒ දේශපාලන පක්ෂ ලබා ගන්නා ඡන්ද ප්‍රමාණය අනුව ඒ ඒ පක්ෂ සඳහා පාර්ලිමේන්තු ආසන වෙන් නොවන බව මිට ඉස්සර පෙණුනේ මොන නායකයාටද ? මොන නායකුටවත් ඒක පෙනුණේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒක පොතේ තියෙන්නෙ.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
මොන නායකුටවත් එය පෙනුණේ නැහැ. නමුත් අපේ නායකතුමාට ගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාට එය පෙනුණු නිසා තමයි එතුමා ඊට පිළියමක් වශයෙන් එතුමා—මහරගම මන්ත්‍රීතුමා කී—අනුපාත ඡන්ද ක්‍රමය ඇති කරන්න සූදානම් වුණේ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
අනුපාත ඡන්ද ක්‍රමය තියෙන්නෙ පොතේ විතරයි.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
පොතේ තොවෙයි. අපි ඒක නිසි වෙලාවට ගේන්නම්. නිසි වෙලාවට සම්මත කරන්නම්. අනුපාත ඡන්ද ක්‍රමයෙන් පස්සේ මේ රටේ මහා මැතිවරණ පවත්වන විට වෙන්නේ මොකක්ද, යන වග තමුන්නාන්සේලා දන්නවා.

ඊළඟට තමුන්නාන්සේලා කතා කරන හය වැනි සංශෝධනය ගැන තත්ත්වය මොකක්ද ? හය වැනි සංශෝධනය නිසා තේද අද අනුර බණ්ඩාරනායක මහතා අට දෙනෙක් එක්ක විරුද්ධ පක්ෂයේ නායකතුමා වී ඉන්නේ. [බාධාකිරීමක්] නැහැයි කියන්න බලන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ඒකෙන් ත්‍රස්තවාදයට පෝර දැම්මක් කළා. ත්‍රස්තවාදය වැඩිකරන්න පෝර දැම්මක් කළා ඒකෙන්.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
තමුන්නාන්සේ එක කාලයක් ගම්පහ වත්තක පෝර දැම්මා ත්‍රස්තවාදයට. හය වැනි සංශෝධනය සම්මතවුණු නිසා තමයි අද මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ මේ රටේ. ඒකටයි ත්‍රස්තවාදීන් විරුද්ධ. මෙ රටේ සිහලයාගේ අයිතිවාසිකම් ලාංකිකයන්ගේ අයිතිවාසිකම් අකුරට ආරක්ෂා කළ පනත් කීපයක් පාර්ලිමේන්තුව සම්මත කළා. තමුන් අවාසනාවකට වාගේ අපට මේ තත්ත්වයට මුහුණ දෙන්නට සිදු වුණා. මේ තත්ත්වයට මුහුණ දීම මේ රට මවු බිම කර ගත් සැම කෙනෙකුගේම යුතුකමක් හැටියට සැලකිය යුතුයි.

මම කලින් මතක් කළ විධියට අපි ත්‍රස්තවාදය එක්ක පමණක් තොවෙයි සටන් කරන්නේ. ඊලාම් ලබා ගන්න අදහස් කරන උදවිය එක්ක තොවෙයි අපි සටන් කරන්නේ. මේ මුළු රටම යටත් කර ගන්නට එන අය එක්ක අපට සටන් කරන්න සිදු වී තිබෙනවා. ඒ නිසා විරුද්ධ පක්ෂයේ සිටින ගරු මන්ත්‍රීවරුනි, කරුණාකර මේ තත්ත්වය අවබෝධ කර ගන්න. මෙය තමුන්නාන්සේලාට අමුතුවෙන් කියන්න වුවමනා දෙයක් තොවෙයි. තමුන් විවේචනය කරන්න ඕනෑ නිසා තමුන්නාන්සේලා හැමදම විවේචනය කර කර ඉන්නවා. තත්ත්වය හැමදම උග්‍ර වෙමින් පවතිනවා.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)
ආණ්ඩුව කයිවාරු ගහනවා.

පර්සි සමරවීර මහතා
(திரு. பேஸி சமரவீர)
(Mr. Percy Samaraweera)
මගේ කතාව අවසාන කරන්න කලින් මම කලින් කී විධියට එක් කරුණක් සඳහන් කරන්න ඕනෑ. මේ රටේ අවුරුදු දෙදහස් පන්සීයයක අඛණ්ඩ ඉතිහාසයක් තිබෙන ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට මිට ඉස්සර කවුරුවත් අත තිබ්බේ නැහැ. අති පූජනීය වස්තුවක් හැටියට අප සලකන මේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ඉන්දියාවේ පහළ වුණු අශෝක අධිරාජයාගේ කාලයේදී එතුමාගේ දියණියන් වූ සංඝමිත්තා රහන් මෙහෙණින් වහන්සේ විසින් මේ රටට වැඩම කරවනු ලැබුවේ ලක්දිව රජ කළ දේවානම් පියතිස්ස රජතුමාගේ කාලයේදීයි. ඒ නිසාම ජම්බුද්වීපය කියන රටට බරණැස් නුවර අයත් වන රටට යුතුකමක් තිබෙනවා තේද, මේ ජය ශ්‍රී මහා බෝධීන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වහන්සේට ආරක්ෂාව සැලසීමට. මේ රටේ බෞද්ධයන් ආත්ම පරිත්‍යාගයෙන් එය ආරක්ෂා කළ අවස්ථා මේ රටේ තිබෙනවා. ඒ නිසා මේ කළ විනාශය ගැන ඉන්දියානු මහා ආණ්ඩුව කියන්නේ මොකක්ද කියා අපි ඒ ආණ්ඩුවෙන් ඇසිය යුතුව තිබෙනවා. මේ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිළිබඳ කටයුතුවලට "යුනෙස්කෝ" නමැති ආයතනයත් සම්බන්ධ වී තිබෙනවා. 'යුනෙස්කෝ කියන්නේ ලෝකයේ රටවල් කීපයක්ම සම්බන්ධ වී තිබෙන ආයතනයක්. ඒ නිසා මම මේ අවස්ථාවේදී අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ මේ රජයෙන් ඉල්ලා සිටිනවා, ශ්‍රී මහා බෝධීන් වහන්සේ සම්බන්ධ මේ ඛේදවාචකය ගැන මුළු ලෝකයටම ආයාචනා කරන්නය කියා. එවිට සියලුම බෞද්ධ රටවල් මේ සම්බන්ධයෙන් නැඟී සිටිනවාට කිසිම සැකයක් නැහැ.

ජාතික ආරක්ෂක ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින නිසා මගේ හිතට එකඟව මේ අවස්ථාවේදී කළ යුතු යෝජනා දෙකක් තිබෙනවා. මේ යෝජනා දෙකෙන් එකක් මෙයයි :

එළුවත්කුලමේ ඉඳලා පටන් ගත් මේ හයානක ගමන ගැන, ත්‍රස්තවාදීන් අනුරාධපුරයට ඇවිත් කළ මහා විනාශය ගැන විස්තර කළ ගොවිපොළක කම්කරුවන් දෙදෙනකුගෙන් මට දැන ගන්න ලැබුණු දේයි, මම කියන්නේ. යුධ හමුද ඇඳුම් ඇඳ ගත් මේ ත්‍රස්තවාදීන් පිරිස මේ සිද්ධියට ඉස්සරින් දවසේ ඇවිත් ඒ ගොවිපොළේ කීප දෙනෙක් එක්ක සාකච්ඡා පවත්වා තිබෙනවා. ත්‍රස්තවාදීන් අතර හොඳට සිංහලෙන් කථා කළ කෙනෙකුත් ඉඳලා තිබෙනවා. ඒ අය කියා තිබෙන්නේ මොකක්ද ? "අපට ආරංචියක් තිබෙනවා, අනුරාධපුර නගරයටයි ශ්‍රී මහා බෝධීන් වහන්සේටයි අපරාධයක් කරන්න යනවාය කියා. ඒ නිසා ඒවා බේර ගන්න ඕනෑ, අපි මේ අවට සැරිසරමින් ඉන්නවා, ඒ පිළිබඳ මොනයම් හෝ ආරංචියක් ලැබුණොත් අපට කියන්න. " ඒ නිසා ඒ ගොවිපොළේ උදවිය හිතුවා, මේ උදවිය ඇවිත් තිබෙන්නේ ඇත්ත වශයෙන්ම හමුදාවෙන්ය කියා. ඒ නිසා, ඒ අයගේ කීම උඩ විකක් කල්පනාවෙන් හිටියා. නමුත් සිද්ධිය වුණාට පස්සෙයි ඒ අය දැන ගත්තේ, අර විධියට කථා කළ උදවිය—ත්‍රස්තවාදීන්—තමයි, මේ විනාශය කර තිබෙන්නේ කියා. එයින් පෙනෙනවා, ඒ ත්‍රස්තවාදීන් ඊට කලිනුත් ඒ අවට සැරිසරා තිබෙන බව.

මම ඒ සිද්ධිය තුළින් කියන්න යන්නේ මෙයයි ; මේ සටනේදී මහජනතාවගෙන් යම්කිසි සහායක් බලාපොරොත්තු වෙනවා නම්—හමුදාවත් බලාපොරොත්තු වෙනවා, ජනතා සහාය—මිට වඩා සම්බන්ධීකරණයක් තිබෙන්න ඕනෑ. දෙවැනි ලෝක යුද්ධ කාලයේදී හිටියා, " සිවිල් ඩිෆෙන්ස් කමිෂනර් " කෙනෙක්. ඒ වගේ තනතුරක් ඇති කොට සුදුසු කෙනෙක් ඊට පත් කරන්න ඕනෑ, සියලුම බලතල ඇතිව. ඒ විධියට මේ සටනට ජනතාවගේ සහායත් ලබා ගැනීම සඳහා තියම විධියේ සම්බන්ධීකරණයක් ඇති කරන්න ඕනෑ.

ඒ අතර ජනතාව බලාගෙන ඉන්නවා, " මේ සටනේදී අපි සහය වන්නේ කොහොමද " කියා. නමුත් ඒ අයගේ සහාය තියම ආකාරයෙන් ලබා ගන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් තවම යොදා නැහැ. ඒ නිසා මම යෝජනාවක් කරන්න කැමතියි. ආසන මට්ටමින් ඒ වගේ වැඩ පිළිවෙළක් දියත් කරන්න අපේ මන්ත්‍රීවරු සියලු දෙනාම සූදානම්. එක වසමකින් අපට පුළුවන් නම් මේ සටනට එක්ක යන්න පුළුවන් හොඳ කොල්ලො විසිපස් දෙනෙක් හොයා ගන්න. මාසයක්—දෙකක් ඇතුළතදී ලක්ෂ පහක හමුදාවක් හද ගන්න අපට පුළුවන්. නැවතත් මොන අවස්ථාවකදී ත්‍රස්තවාදීන් අර විධියේ සටනක් මෙහෙයවයිද දන්නේ නැහැ. ඒ නිසා එවැනි අවස්ථාවකට මුහුණ දෙන්න පුළුවන් විධියට අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කරන්නය කියා ඉල්ලා සිටින්න කැමැතියි.

අවසාන වශයෙන්, මට මේ අමතර කාලය ලබා දීම ගැන නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතර, මා ඉදිරිපත් කළ ඒ යෝජනා දෙක පිළිබඳව ජාතික ආරක්ෂක ඇමතිතුමාගේත්, පොදුවේ රජයේත් අවධානය යොමු වේයයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 4.05

නිශ්ශංක විජයරත්න මහතා (අධිකරණ ඇමතිතුමා)
(திரு. நிஸங்க விஜயரத்ன — நீதி அமைச்சர்)
(Mr. Nissanka Wijeyeratne–Minister of Justice)

Mr. Chairman, there seems to be a completely new emotional approach to the entire problem of the Emergency in Sri Lanka coming from the ranks of the Opposition. Naturally, they, like us, feel deeply and emotionally involved when anything hapens in or near Anuradhapura, particularly the sacred bo-tree which is of such deep religious significance to everyone in Sri Lanka.

I notice today almost a new note – apart from the criticisms made – a new note, a desire expressed to work out some sort of working arrangement with the Government to succeed in the crisis that faces the country. In fact, it was clearly expressed by the hon. Member for Kalawana (Mr. Sarath Muttetuwegama) when he said the time was opportune for the people to get together. He was frightened that conditions in Sri Lanka were rapidly approaching a situation when Neanderthal Man would stalk the land. He was only echoing something that had been uttered earlier in this House by the distinguished father of the hon. Member for Maharagama in another context. The hon. Member for Kalawana referred to the real or imaginary grievances of an ethnic group. I am happy that he did so because, for the first time, there has been an acceptance of the fact that the grievances could very well be imaginary, for quite often the impression is given by the critics of the Government, particularly of the Left, that there are real grievances that need rectification. Let us see, Mr. Chairman, how this getting together could take place. The hon. Member for Kalawana was worried about safety. That is his paramount consideration. We too agree, the safety of every one in this country, be they the Sinhalese, be they the Tamils who may also be at the receiving end, or the Muslims who were at the receiving end at the hands of the terrorists. All communities, in fact, require safety, even the greater part of the peace-loving Tamils who are being held to ransom by irresponsible terrorists in Sri Lanka. But the getting together has to be done within the framework of the Constitution and, of course, the law.

I can very well sympathize with the emotional cry of the Member for Maharagama (Mr. Dinesh Gunawardena) that the one-time Prime Minister of Sri Lanka ; the one-time Leader of the Opposition, Mrs. Bandaranaike, should be granted her civic rights. Perhaps, it is his view that the law should be overruled merely because terrorism has created an atmosphere of distress.

Within the framework permissible to him, the President of Sri Lanka has endeavoured to give an opportunity for people and those in political positions to get together.

The Communist Party were anxious for a solution. Of course, I do not agree with the solution that they have always advocated in regard to minority groups. I believe that many, many years ago in Sri Lanka they advocated remedial measures in respect of the Tamil community, which they have now chosen to forget ! I do not propose to rake up long memories, but sometimes it may be necessary for the benefit of the Communist Party to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය නිශ්ශංක විජයරත්න මහතා]

send them extracts of the solutions they proposed over a decade ago. But certainly they were anxious for a solution, and utilized the opportunity given by His Excellency the President and, on more than one occasion, they have participated in the discussion in the attempt to work out a workable solution for the confrontations in our country.

The Lanka Sama Samaja Party has always sympathized with the minorities. That has been part of its policy. Long ago they took a most active part in the struggle for the rights of the Indian workers. Nooloya, the Bracegirdle case, the problems of the depressed communities in Jaffna, occupied the attention of the Lanka Sama Samaja Party long before they did come within the ken of the Tamil United Liberation Front or the Federal Party or the Tamil Congress, and I must say to the credit of Dr. Colvin R. de Silva that in those discussions that were held with the President elsewhere, an earnest plea was made to try to see that the discussions ended on a constructive note. But I think the Left, other than those two parties, has done a disservice to the cause of communal concord in Sri Lanka.

The Member for Maharagama could, if he then valued harmony in Sri Lanka and was out to resolve the problems of discordance have assisted by participating in the discussions to which he and his party were invited by His Excellency the President. That they chose to keep out of the discussion will remain to the eternal discredit of that party and smear the responsibility that it now claims.

As far as the JVP is concerned, they were never interested in many of the causes they purported to speak on. When they came up nearly two decades ago, their initial lectures began with a virulent attack on Indian neo-imperialist expansion. The first lectures related to the dangers that Sri Lanka and the neighbouring countries were exposed to from India. Now, of course, they have revealed their hand. They have found refuge in India. They suport the terrorists who are out to divide Sri Lanka, and they provide one of the surest reasons for our Government to extend the Emergency in our country. They were spared the ignominy of continued stay in jail, to which they had been committed by Mrs. Bandaranaike's Government. They were spared that and given an opportunity of rehabilitation in society by His Excellency the President. But unfortunately they did not avail themselves of that opportunity. They misused it. And they have not participated in finding a solution. The only solution they conceive of is a military one – a terrorist take-over in the South synchronized with a terrorist take-over in the North so that ultimately a government that does away with democracy, that does away with the cultural heritage not only of the Sinhalese but also of the Tamils is ensured in this Island of ours.

As for the Sri Lanka Freedom Party, surely its leader in Parliament, Mr. Anura Bandaranaike, the Second Member for Nuwara Eliya-Maskeliya, was not precluded from participating in the All Party Conference and contributing towards the search for a solution. Today, he, others and Mrs. Bandaranaike herself say that the restoration of civic rights is pre-condition for political co-operation.

The TULF has not avoided reaching out to the President directly or indirectly in an attempt to find a solution for the benefit of the Tamil community.

It is a sad comment on those who profess to follow the idealism of the late Mr. S. W. R. D. Bandaranaike, the founder of their party, that they are unable to contribute towards the solution of the political problems of Sri Lanka without a corresponding benefit being bestowed upon them, and absolution to them from the rigours cast by due legal process. Surely this is a new concept, perhaps like the Attanagalla doctrine, a new political doctrine of *Paticca Samuppāda* of dependent origination –"give us our freedom ; then only will we show our love and loyalty to our country". If they are true to the ideals and commitment of the late Mr. S. W. R. D. Bandarnaike, who never refused to give his ideas to the Government openly and in private when he was in the Opposition, surely those who profess to follow those ideals should rethink their course of action in this hour of dire need.

The hon. Member for Maharagama attempted to throw blame on the Government for identifying the terrorist movement with Marxism. In rhetorical style he raised the question as to whether General Weeratunga sensed Marxism in the terrorists he was sent out to crush. He rhetorically asked the question, is the Left to blame that the Government failed to identify Marxism with the terrorists at the APC talks ? He says that the Government now exposes and cries aloud about the Marxist connection. That is true. Time taught us the truth, and when time taught us the truth, we had no other option but to bring that truth to the knowledge of our countrymen and the world. Uma Maheswaram's group, Mr. Chairman, has proudly claimed that connection, has expressed that as the ideal, and justified their resort to terrorism not as a reaction against what some others say is Sri Lankan Sinhalese violence but as a positive approach towards the creation of a Marxist state with its attendant dictatorship so that the people can be freed, in their own concepts.

As for Anuradhapura, every Tamil party – now terrorist party – wishes to shed its connection. The air is full of their denials. That was not so in the first few hours. Why ? It is because they all have come to realize that that brutal attack in Anuradhapura has smeared them even in the eyes of the misguided people in Sri Lanka and abroad who have hitherto suported them. So they have been quick to repudiate their connection.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Mr. Chairman, the most unfair attack was levelled against the Hon. Minister of National Security. They asked of him "Why did you not change the dates of the Mahapola ?" The date of the Mahapola are fixed. The subject belongs to a different Ministry. He is honoured by invitation extended to him for having fathered this scheme.The change of dates was not made. The programme will be adhered to. The attempt to smear the Minister is an attempt to disconnect him from his attachment to Anuradhapura. We all are attached to Anuradhapura. I personally feel terribly sad that a city, a sacred area I helped to clear, a town to which I was sent specially selected by the late Mr. S. W. R. D. Bandaranayake, an area we cleared with the support of Mrs. Bandaranaike, has been besmirched by this tragedy. I have not gone to Anuradhapura. That does not mean that my love for it has ceased. She has not gone to Anuradhapura. I do not presume her love for the sacred area is over. If the Hon. Minister of National Security is to tear round the country, to go to every space where an incident takes place, then the criticism will come on him, "Why do you not concentrate on giving directions insted of running around the country ?"

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுப் பிரதித் தலைவர் அவர்கள்)
(The Deputy Chairman of Committees)

I would like to bring to the notice of the Hon. Minister that the Adjournment has to be moved at 4.30 p.m.

නිශ්ශංක විජයරත්න මහතා
(திரு. நிஸங்க விஜயரத்ன)
(Mr. Nissanka Wijeyeratne)

Sir, I think there is a basis for the unity that the Opposition likes to have. All parties condemn the partition of Sri Lanka. All commonwealth countries have done so, including Australia where some people talked irresponsibly on misinformation that a civil war was raging here. The United States of America believe in our integrity despite the fact that this original cry for Eelam arose in the hearts of Massachusetts. India, too, despite her own problems in the Punjab, in Tripura and in Assam is against separation. It is only the terrorists who ask for it. The TULF sometimes says they are for unity, but sometimes they say "Yes" and "No." They sometimes talk of two provinces as the basis of negotiation, forgetting that if you concede two provinces, quite truly could the Kandyans ask for their old five provinces.

His Excellency the President's solution has been – and a solution which in the minds of all reasonable people is sensible – district with full powers, powers that are consistent with the sovereignty of Sri Lanka and with the right for districts within the Northern Province to work. Certainly the Eastern Province is written off by the own irresponsible, intrasigent, belligerent and ruthless attitude of the terrorists themselves in the Batticaloa and Amparai Districts. We do not blame India. The Opposition tried to say that we were blaming India. We do not do so. Mr. Chairman, I am as much an Indian as any Englishman would be European. We are part of the cultural heritage of that country, but we have evolved in a different way. We are a soverign Island. We shall not negotiate with any people within our boundaries at the insistence of any foreign country. If India is anxious to help us her assistance would always be welcome, and it is in that spirit that His Excellency has co-operated with the efforts of India to help to find a solution. It is true that the terrorists find shelter in India, perhaps unknown to the Indian Government. India has the same problem across her border, and they have not hesistated to condemn and to expose this fact. Our exposure of the fact that help comes from across the sea, our exposure of sympathy for the terrorists from abroad, does not necessarily mean that we are hostile to India. We are not hostile to the Tamils. But we are hostile to the terrorists. And just as much as the Opposition itself views the present moment as one of the gravest urgency, one of dire seriousness, we see no better argument than in that realization of the Opposition as to why there should be total support for the passage of renewal of the Emergency law in Sri Lanka.

Thank you.

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1985 මැයි 24 වන සිකුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 4.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது. 1985 மே 24 வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

It being 4.30 p.m., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Friday, 24th May 1985.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන් නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රයත්න නොවීමයා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 1985 මැයි 24 වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් තියේය.

அப்பொழுது, பி. ப. 4.30 மணியாகிவிடவே குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்கள்.

அதன்படி, பாராளுமன்றம் 1985 மே 24 வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 4.30 p.m., MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

Adjourned accordingly untill 9.30 a.m. on Friday, 24th May 1985.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

එම්. වී. කේ. අයිරාංගනී මහත්මිය : වැන්දඹු විශ්‍රාම වැටුප

திருமதி எம். வி. கே. ஐராங்கனி : விதவை ஓய்வூதியம் ஆதியன

MRS. M. V. K. IRANGANIE : WIDOW'S PENSION ETC.

193/85

1. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක මහතා (ගාල්ල)**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க — காலி)
(Dr. W. Dahanayake–Galle)

අග්‍රාමාත්‍යතුමා සහ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා සහ මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා සහ හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමාගෙන් ඇසූ ප්‍රශ්නය :

(අ) වසර 17 ක සේවයෙන් පසු, 1983 දෙසැම්බර් මස 12 වැනි දින මියගිය, තංගල්ලේ (මහාමාර්ග දෙපාර්තමේන්තුවේ) කාර්මික නිලධාරි එම්. එම්. රත්නපාල මහතාගේ වැන්දඹුව වන, ගාල්ලේ හීන්පැන්දොල අංක 8/3 දරන ස්ථානයෙහි පදිංචි එම්. වී. කේ. අයිරාංගනී මහත්මියට අය විය යුතු වැන්දඹු විශ්‍රාම වැටුප, මරණ පාරිතෝෂිකය, අර්ථසාධක අරමුදල හා අනෙකුත් ගෙවීම් ඇය වෙත ගෙවීමට සලස්වන්නේද ?

(ආ) එසේ නොකරන්නේ නම්, ඒ මත්ද ?

பிரதம அமைச்சரும், உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும், பெருவீதிகள் அமைச்சரும், அவசரகால சிவில் நிர்வாக அமைச்சருமான வரைக் கேட்ட வினா :

(அ) பெருவதிகள் திணைக்களத்தில் தொழில்நுட்ப அதிகாரியாக 17 வருடங்கள் சேவையாற்றி 12 டிசம்பர் 1983 இல் காலமான தங்கல்லையைச் சேர்ந்த திரு. எம். எச். ரத்னபாலாவின் விதவை காலி, ஹின்பென்தொல, 8/3 ஆம் இலக்கத்தில் வசிக்கும் திருமதி எம். வி. கே. ஐராங்கனி என்பவருக்குரிய, விதவை ஓய்வூதியம், மரணப் பணிக்கொடை, சேமலாப நிதி, ஏனைய பாக்கிகள் கொடுபட அவர் நடவடிக்கை எடுப்பாரா ?

(ஆ) இல்லையேல், ஏன் ?

asked the Prime Minister and Minister of Local Government, Housing and Construction, Minister of Highways and Minister of Emergency Civil Administration :

(*a* Will he cause the widow's pension, death gratuity, provident fund, and all other dues, to be paid to Mrs.M. V. K.Iranganie of 8/3, Heenpandola, Galle, widow of the late Mr. M. H. Ratnapala, Technical Officer, (Department of Highways), of Tangalle, who died on 12th December, 1983, after 17 years of service ?

(*b*) If not, why ?

ආර්. ප්‍රේමදාස මහතා (අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමා, මහාමාර්ග කටයුතු පිළිබඳ ඇමතිතුමා හදිසි අවස්ථා මහජන පරිපාලන ඇමතිතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(திரு. ஆர். பிரேமதாச — பிரதம அமைச்சரும் உள்ளூராட்சி, வீடமைப்பு, நிர்மாண அமைச்சரும் நெடுஞ்சாலைகள் அமைச்சரும் அவசரகால சிவில் நிர்வாக அமைச்சரும் பாராளுமன்றச் சபை முதல் வரும்)

(Mr. R. Premadasa – Prime Minister, Minister of Local Government, Housing & Construction, Minister of Highways, Minister of Emergency Civil Administration and Leader of the House of Parliament)

(අ) ඔව්. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය ලියකියවිලි වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් කාර්යාලය වෙත 1985.04.29 වැනි දින ඉදිරිපත් කර ඇත. මරණ පාරිතෝෂිකය මසක් ඇතුළත ගෙවනු ඇත.

(ආ) ඉහත (අ) අනුව ප්‍රශ්නය පැන නොනගී.

(அ) ஆம். ஓய்வூதியம் செலுத்துவதற்கான விதவை ஓய்வூதியப் பத்திரங்கள் ஓய்வூதிய காரியாலயத்திற்கு 29. 4. 1985 இல் அனுப்பப்பட்டுள்ளது. ஒரு மாதத்திற்குள் மரணப் பணிக் கொடை கொடுக்கப்படும்.

(ஆ) மேற்குறிப்பிட்ட (அ) இன் பிரகாரம் கேள்வி எழ இடமில்லை.

(*a*) Yes. Pension papers for payment of Widows and Orphans Pension have been forwarded to Widows and Orphens Pension Office on 29.04.1985. The gratuity will be paid within one month.

(*b*) Does not arise in view of (*a*).

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සවකීය කථාවල තිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1985 ජූනි 6 වන බ්‍රහස්පතින්ද

තොළක්මවා ලැබෙතසේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1985 ஜூன் 6, வியாழக்கிழமைக்குப் பிந்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSÀRD,

not later than

Thursday, 6th June 1985

Contents of Proceedings	:	**From 10 a.m to 4.30 p.m. on 23.05.1985**
Final set of manuscripts received from Parliament	:	**7.56 p.m. on 23.05.1985**
Printed copies despatched	:	**24.05.1985 morning**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org